# පළාත් පාලන ආයතනවල සභික නියෝජනය දෙගුණවීම හා එහි ප්‍රායෝගික බලපෑම

## පෙරවදන

එතෙක් පැවති සමානුපාතික නියෝජනය වෙනුවට මිශ්‍ර සමානුපාතික ක්‍රමය යටතේ 2017 පැවති පළාත් පාලන මැතිවරණයෙන් පසු මහා නගර සභා, නගර සභා හා ප්‍රාදේශීය සභා යන තෙවර්ගයේ පළාත් පාලන ආයතනවලට තෝරා පත්කරගන්නා ලද මහජන නියෝජිතයින් (සභිකයින්) සංඛ්‍යාව තිබූ ප්‍රමාණය මෙන් දෙගුණයක් බවට පත් විය.

පළාත් පාලන ආයතන සභිකයින්ගේ සමස්ථ වැඩිවීම සහා රැස්වීම් ශාලාවල ඉඩ පහසුකම්වල පටන් දීමනා ගෙවීම් දක්වා විවිධාකාරයෙන් ඇතිකිරීමට සමත් වී තිබෙන බලපෑම පිළිබඳව අදාළ මූලාශ්‍ර ඇසුරෙන් විග්‍රහ කිරීම තුළින් පුළුල් අවබෝධයක් ලබාගැනීමට හැකි වේ.

මෙලෙස සිදු වී ඇති මහජන නියෝජිතයින්ගේ සංඛ්‍යාත්මක වැඩිවීම රජයට හා ජනතාවට බලපා ඇති ආකාරය පිළිබඳව කෙරෙන මෙම සංසන්දනාත්මක විග්‍රහය අවධානයට යොමු කළ යුතු ප්‍රතිපත්තිමය කරුණු පිළිබඳ අවබෝධයක් ලබාගැනීමට ද අදාළ කරගත හැකි වනු ඇත.

මෙම වාර්තාව සඳහා පළාත් පාලන ආයතනවලට අදාළව ලබාගත හැකිව තිබූ ප්‍රකාශයට පත් කරන ලද දත්ත හා තොරතුරු විශ්ලේෂණයට භාජනය කරන ලදී. මෙහිලා ගැසට් පත්‍ර හා මූලාශ්‍ර රාශියක් පරිශීලනය කොට රැස් කරගත් දත්ත හා තොරතුරු මෙම විග්‍රහයට යොදාගැනීම සඳහා නොමසුරුව ලබාදීමට කටයුතු කළ, පළාත් පාලන ක්ෂේත්‍රයේ උන්නතිය උදෙසා නිරන්තරයෙන් කටයුතු කරන විශ්‍රාමික නාගරික කොමසාරිස්වරයෙකු, පළාත් පාලනය පිළිබඳ ජ්‍යෙෂ්ඨ සම්පත්දායකවරයෙකු හා උපදේශකවරයෙකු ලෙස කටයුතු කරන ගාමිණී ගුණසේකර මහතාගේ දායකත්වයට ප්‍රණාමය පුද කළ යුතුය.

පළාත් පාලන ආයතන සභිකයින්ගේ වැඩිවීම එක් එක් පැතිකඩ ඔස්සේ සමාජයීය හා ආර්ථිකමය වශයෙන් බලපා ඇති ආකාරය පිළිබඳව සැළකිල්ලට ගෙන ඉදිරිපත් කොට ඇති නිගමන හා නිර්දේශ රටේ හා පළාත් පාලනයේ උන්නතිය උදෙසා අදාළ කරගැනීමට ප්‍රතිපත්ති සම්පාදකයින්ගේ අවධානය යොමු වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

නියෝජ්‍ය අධ්‍යක්ෂ (පර්යේෂණ හා සංවර්ධන)
පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය

**පසුබිම**

1987 දී 13වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මඟින් එතෙක් මධ්‍යම රජය යටතේ පැවති මෙරට පළාත් පාලන ආයතන පද්ධතිය පළාත් සභා යටතට පත්කරනු ලැබිණි. එතැන් පටන් 2017 දක්වා පළාත් පාලන මැතිවරණ සමානුපාතික නියෝජනය යටතේ පවත්වන ලදී. එලෙස පළාත් පාලන ආයතනවල සභිකයින් තෝරාගැනීම සඳහා වසර 30 ක පමණ කාලයක් අඛන්ඩව පවත්වාගෙන එන ලද සමානුපාතික නියෝජන ක්‍රමවේදයට අමතරව කොට්ඨාශ පදනමද අදාළ කරගනු ලදුව 2017 වසරේදී පළාත් පාලන මැතිවරණය මිශ්‍ර සමානුපාතික නියෝජනය යටතේ පවත්වන ලද අතර, ඊට සමගාමීව දිගු කාලයක් පුරා පැවති ඉල්ලීම සපුරාලමින් පළාත් පාලනය සඳහා කාන්තා නියෝජනයට 25% කෝටාවක්ද ලබා දෙනු ලැබිණි.

තවද, 2012 අංක 22 දරන පනත යටතේ ලබාදී තිබූ 25% ක තරුණ නියෝජනයද, 2017 අංක 16 දරන පනත මඟින් 30% දක්වා වර්ධනය කරන ලදී. එහෙත් කාන්තා නියෝජනය මෙන් තරුණ නියෝජනය අනිවාර්ය කොට නොතිබීම හේතුවෙන් පළාත් පාලන ආයතන සඳහා තරුණ අපේක්ෂකත්වය වර්ධනය වී පළාත් පාලනයේ තරුණ නියෝජනයේ වැඩිවීමක් සිදුවී නැත.

කොට්ඨාශ පදනම යටතේ 60% ක්ද, සමානුපාතික පදනම යටතේ 40% ක්ද, වශයෙන් 2017.10.12 දිනැති 2022 අංක 22 දරන පනත මඟින් ලබාදී ඇති ප්‍රතිපාදන මත පළාත් පාලන ආයතන 341 කට සභිකයින් තෝරා පත්කරගැනීම සඳහා 2017දී මිශ්‍ර සමානුපාතික නියෝජනය යටතේ පළාත් පාලන මැතිවරණය පවත්වන ලදී. මෙම නියෝජන ක්‍රමවේද දෙක යටතේ 2017 පැවති මැතිවරණයෙන් එතෙක් පළාත් පාලන ආයතන සඳහා තේරී පත්වූ සභික ප්‍රමාණය දෙගුණ වීමටද, කාන්තා නියෝජනය වර්ධනය වීමටද හේතු වී ඇත. ඒ අනුව පත් වූ සභිකයින් 8740ක සංඛ්‍යාවක් 2018 සිට මේ දක්වා පළාත් පාලන ආයතන පද්ධතිය(මහා නගර සභා, නගර සභා හා ප්‍රාදේශීය සභා) නියෝජනය කරනු ලබයි. එය සංඛ්‍යාත්මකව ඡන්ද දායකයින් විසින් පත් කරන ලද සභිකයින් 8356 කින් හා එක් එක් පක්ෂ මඟින් නම් කරනු ලබන සභිකයින් 384 කින්ද සමන්විත වේ.

මෙලෙස 2017 පළාත් පාලන මැතිවරණයෙන් පසු සිදු වූ සභිකයින්ගේ ප්‍රමාණාත්මක වැඩිවීම වර්තමානයේ ආර්ථික, සමාජීය හා දේශපාලනික ගැටළු රාශියක් නිර්මාණය වීමටද, එමඟින් සමස්ථ පළාත් පාලන ක්ෂේත්‍රයද අර්බුදකාරී තත්ත්වයකට පත්වීමටද හේතු වී ඇත.

**අරමුණ**

මහා නගර සභා, නගර සභා, හා ප්‍රාදේශීය සභාවලින් සමන්විත මෙරට පළාත් පාලන ආයතන පද්ධතිය සඳහා සමානුපාතික නියෝජනය යටතේ 2011 වසරේදී පත්කරගන්නා ලද්දේ සභිකයින් 4483 කි. එහෙත් 2017 වසරේ කොට්ඨාශ ක්‍රමය අදාළ කරගැනීමෙන් පසු පවත්වන ලද මිශ්‍ර සමානුපාතික මැතිවරණය මඟින් එම සංඛ්‍යාව 8740 දක්වා වැඩිවීම පෙර තිබූ සභික සංඛ්‍යාව දෙගුණ වීමටද හේතු වී ඇත . එබැවින් 2017 වර්ෂයේදී කොට්ඨාශ ක්‍රමය හඳුන්වාදීමත් සමඟම පැවති මිශ්‍ර මැතිවරණය මඟින් පළාත් පාලන නියෝජනය දෙගුණයකින් වැඩිවීම ආර්ථික, දේශපාලනික හා සාමාජීය වශයෙන් මෙරටට සිදුකොට ඇති බලපෑම විමසුමට ලක්කිරීමද, එම තත්ත්වය නිවැරදි කිරීම උදෙසා ගතයුතු නිර්දේශ ඉදිරිපත් කිරීමටද මෙම විශ්ලේෂණය මඟින් අපේක්ෂා කෙරේ.

**ක්‍රමවේදය**

මැතිවරණ කොමසාරිස් කාර්යාලය මඟින් පළාත් පාලන ආයතනවල සභිකයින් තෝරා ගැනීම සඳහා පවත්වනු ලැබූ පළාත් පාලන මැතිවරණ ප්‍රතිඵල රජයේ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබේ .එලෙස මැතිවරණ කොමසාරිස්වරයා විසින් 1988දී හා 2017දී පවත්වන ලද පළාත් පාලන මැතිවරණ ප්‍රතිඵල ප්‍රකාශයට පත් කරන ලද ගැසට් නිවේදනවල සඳහන් දත්ත හා තොරතුරු මෙම විශ්ලේෂණය සඳහා යොදාගෙන ඇත .ඊට අමතරව පළාත් පාලන හා පළාත් සභා විෂය භාර අමාත්‍යවරයා විසින් නිකුත් කොට ඇති එක් එක් සභාවලට අදාළ සංස්ථාපන නිවේදන හා ඒ ඒ පළාත් සභා විසින් පළ කරන ලද ගැසට් නිවේදනද මූලාශ්‍ර ලෙස මෙම විග්‍රහය සඳහා යොදාගෙන ඇත.

ඒ අනුව පළාත් වශයෙන්, දිස්ත්‍රික්ක වශයෙන් හා පළාත් පාලන ආයතන වර්ග අනුව පළාත් පාලන ආයතනවලට 1988 දී තේරී පත්වී ඇති සභික සංඛ්‍යාව හා 2018 න් පසු කොට්ඨාශ නියෝජනය සහිත මිශ්‍ර සමානුපාතික මැතිවරණයක් යටතේ සභිකයින් තෝරා ගැනීමට අදාළ තොරතුරු මෙහිදී සංසන්දනාත්මකව විග්‍රහ කොට ඇත.

ඒ අනුව සමානුපාතික මැතිවරණ ක්‍රමය යටතේ හා මිශ්‍ර සමානුපාත මැතිවරණ ක්‍රමය යටතේ පවත්වන ලද පළාත් පාලන මැතිවරණ ප්‍රතිඵල මත පළාත් පාලන ආයතන නියෝජනය කිරීම සඳහා සුදුසුකම් ලබන ලද සභිකයින්ගේ ප්‍රමාණාත්මක වර්ධනය මෙරට ආර්ථික ,දේශපාලනික හා සමාජයීය ගැටලු වර්ධනය වීමට බලපා ඇති ආකාරය අදාළ දත්ත හා තොරතුරු විග්‍රහ කිරීමෙන් හා පර්යේෂකයින්ගේ නිරීක්ෂණද පදනම් කොට පහත නිගමන හා නිර්දේශ ඉදිරිපත් කෙරේ.

**සමානුපාත නියෝජන ක්‍රමය ක්‍රියාත්මක වීමට පෙර දිස්ත්‍රික් මට්ටමෙන් සභික සංඛ්‍යාව**

| **දිස්ත්‍රික්කය** | | **ආයතන ගණන** | | **සභික සංඛ්‍යාව** |
|---|---|---|---|---|
| 1. කොළඹ | ... ... | 20 | ... ... | 285 |
| 2. ගම්පහ | ... ... | 45 | ... ... | 630 |
| 3. කළුතර | ... ... | 28 | ... ... | 383 |
| 4. මහනුවර | ... ... | 50 | ... ... | **779** |
| 5. මාතලේ | ... ... | 25 | ... ... | 346 |
| 6. නුවරඑළිය | ... ... | 25 | ... ... | 281 |
| 7. ගාල්ල | ... ... | 46 | ... ... | 492 |
| 8. මාතර | ... ... | 27 | ... ... | 373 |
| 9. හම්බන්තොට | ... ... | 16 | ... ... | 223 |
| 10. යාපනය * | ... ... | 58 | ... ... | **655** |
| 11. මන්නාරම | ... ... | 16 | ... ... | 166 |
| 12. වව්නියා | ... ... | 11 | ... ... | 119 |
| 13. මුලතිව් | ... ... | 10 | ... ... | 88 |
| 14. මඩකලපුව | ... ... | 21 | ... ... | 192 |
| 15. අම්පාර | ... ... | 26 | ... ... | 221 |
| 16. ත්‍රිකුණාමලය | ... ... | 27 | ... ... | 212 |
| 17. කුරුණෑගල | ... ... | 54 | ... ... | **635** |
| 18. පුත්තලම | ... ... | 26 | ... ... | 319 |
| 19. අනුරාධපුර | ... ... | 35 | ... ... | 552 |
| 20. පොළොන්නරුව | ... ... | 10 | ... ... | 147 |
| 21. බදුල්ල | ... ... | 39 | ... ... | 405 |
| 22. මොණරාගල | ... ... | 13 | ... ... | 142 |
| 23. රත්නපුර | ... ... | 29 | ... ... | 460 |
| 24. කෑගල්ල | ... ... | 26 | ... ... | 413 |
| | එකතුව | 683 | ... ... | 8,518 |

* යාපනය දිස්ත්‍රික්කයට අයත් ආයතන අතර කිලිනොච්චිය දිස්ත්‍රික්කයේ ආයතන ද ඇතුළත් වේ.

සමානුපාත නියෝජන ක්‍රමය පළාත් පාලන මැතිවරණවලට අදාළ කරගැනීමට පෙර පැවති මැතිවරණය යටතේ පත් වූ සභික සංඛ්‍යාව පිරික්සීමේදී වැඩිම සභික නියෝජනය (779) ආයතන 50ක් සඳහා මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයෙන් වාර්තා වී ඇත.

එසේම දෙවන වැඩිම නියෝජනය (655) උතුරු පළාතේ යාපනය දිස්ත්‍රික්කයෙන් ආයතන 58ක් සඳහා (කිළිනොච්චි දිස්ත්‍රික්කයද ඇතුළුව) තේරී පත්වී ඇත.

තවද, වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කය තෙවන වැඩිම නියෝජනය (635) ආයතන 54ක් වෙනුවෙන් තෝරාගෙන ඇත.

**සමානුපාත නියෝජන ක්‍රමයට ක්‍රියාත්මක කිරීමට පෙර ආයතන වර්ගය අනුව සභික සංඛ්‍යාව**

| ආයතන වර්ගය<br>**Type of LA** | ආයතන ගණන<br>**Number of Institutions** | සභික සංඛ්‍යාව<br>**Number of Councilors** |
|---|---|---|
| මහා නගර සභා(MCs) | 12 | 243 |
| නගර සභා(UCs) | 39 | 395 |
| සුළු නගර සභා(TCs) | 83 | 528 |
| ගම් සභා(VCs) | 549 | 7,352 |
| | 683 | 8,518 |

සමානුපාතික නියෝජන ක්‍රමය හඳුන්වාදීමට පෙර මහා නගර සභා (MCs) 12ක් ක්‍රියාත්මක වී ඇති අතර, ඒවායේ සභිකයින් 243ක් නියෝජනය වී ඇත.

එසේම එම ක්‍රමවේදය යටතේ නගර සභා (UCs) 39ක් සභිකයින් 395ක් යටතේ ක්‍රියාත්මක වී තිබේ.

තවද, සුළු නගර සභා (TCs) 83ක්ද, සභිකයින් 528කුගෙන් සමන්විතව ක්‍රියාත්මකව ඇත.

මීට අමතරව, ගම්සභා (VCs) වශයෙන් ආයතන 549ක් ක්‍රියාත්මකව පැවත ඇති අතර, ඒ සඳහා සභිකයින් 7,352ක් නියෝජනය වී ඇත.

ඒ අනුව සමානුපාතික නියෝජනය ක්‍රියාත්මක වීමට පෙර පැවත් වූ පළාත් පාලන මැතිවරණයෙන් ආයතන 683ක් සඳහා සභිකයින් 8518ක් තෝරා පත්කර ගැනීමට කටයුතු කොට ඇත.

**සමානුපාත හා මිශ්‍ර මැතිවරණ ක්‍රම යටතේ දිස්ත්‍රික් මට්ටමින් සභික සංඛ්‍යාවේ වර්ධනය**

1981 සිට 2011 අතර කොට්ඨාස මට්ටමෙන් සභිකයන් තෝරා ගැනීම වෙනුවට ක්‍රියාත්මක වූ සමානුපාතික නියෝජන ක්‍රමය යටතේ තෝරාගත් සභික සංඛ්‍යාව හා 2018. 02. 10 දින මිශ්‍ර මැතිවරණ ක්‍රමය යටතේ තෝරා ගත් සභික සංඛ්‍යාව සංසන්දනාත්මක විග්‍රහය පහත පරිදි වේ.

| පළාත | දිස්ත්‍රික්කය | **2017 දක්වා සභික සංඛ්‍යාව** | **2018 සිට සභික සංඛ්‍යාව (අතිරේක සභිකයන් හැර)** | වැඩි වීම (%) | අතිරේක සභික සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| බස්නාහිර | කොළඹ | 295 | 543 | 84.07 % | 29 |
| | ගම්පහ | 354 | 688 | 94.35 % | 28 |
| | කළුතර | 241 | 457 | 89.63 % | 16 |
| මධ්‍යම | මහනුවර | 339 | 620 | 82.89 % | 17 |
| | මාතලේ | 156 | 273 | 75.00 % | 11 |
| | නුවරඑළිය | 140 | 306 | 118.57 % | 08 |
| දකුණ | ගාල්ල | 242 | 447 | 84.71 % | 32 |
| | මාතර | 198 | 365 | 84.34 % | 18 |
| | හම්බන්තොට | 141 | 262 | 85.82 % | 16 |
| උතුර | යාපනය | 229 | 402 | 75.55 % | 13 |
| | කිලිනොච්චි | 38 | 66 | 73.68 % | 02 |
| | මන්නාරම | 46 | 88 | 91.30 % | 06 |
| | වව්නියා | 52 | 103 | 98.08 % | 11 |
| | මුලතිව් | 38 | 67 | 76.32 % | 05 |
| නැගෙනහිර | මඩකලපුව | 128 | 238 | 85.94 % | 15 |
| | අම්පාර | 201 | 378 | 88.06 % | 15 |
| | ත්‍රිකුණාමලය | 118 | 220 | 86.44 % | 13 |
| වයඹ | කුරුණෑගල | 340 | 620 | 82.35 % | 38 |
| | පුත්තලම | 161 | 306 | 90.06 % | 07 |
| උතුරු මැද | අනුරාධපුර | 203 | 372 | 83.25 % | 31 |
| | පොළොන්නරුව | 91 | 166 | 82.42 % | 07 |
| ඌව | බදුල්ල | 215 | 391 | 81.86 % | 09 |
| | මොණරාගල | 104 | 198 | 90.38 % | 11 |
| සබරගමුව | රත්නපුර | 228 | 423 | 85.53 % | 14 |
| | කෑගල්ල | 195 | 357 | 83.08 % | 12 |
| | | 4,493 | 8,356 | | 384 |

**සමානුපාත හා මිශ්‍ර මැතිවරණ ක්‍රම යටතේ පළාත් මට්ටමින් සභික සංඛ්‍යාවේ වර්ධනය**

| පළාත | 2017 දක්වා සභික සංඛ්‍යාව | 2018 සිට සභික සංඛ්‍යාව (අතිරේක සභිකයන් හැර) | වැඩි වීම (%) | අතිරේක සභික සංඛ්‍යාව |
|---|---|---|---|---|
| බස්නාහිර | 890 | 1,688 | **89.66 %** | 73 |
| මධ්‍යම | 635 | 1,199 | **88.82 %** | 36 |
| දකුණ | 581 | 1,074 | 84.85 % | 66 |
| උතුර | 403 | 726 | 80.15 % | 37 |
| නැගෙනහිර | 447 | 836 | **87.02 %** | 43 |
| වයඹ | 501 | 926 | 84.83 % | 45 |
| උතුරු මැද | 294 | 538 | 82.99 % | 38 |
| ඌව | 319 | 589 | 84.64 % | 20 |
| සබරගමුව | 423 | 780 | 84.40 % | 26 |
| | 4,493 | 8,356 | | 384 |

2017ට පෙර තත්ත්වයට සාපේක්ෂව පළාත් මට්ටමින් සභික වර්ධනයෙන් පළමු තැන බස්නාහිර පළාතෙන්ද (89.66%), දෙවන ස්ථානය මධ්‍යම පළාතෙන්ද (88.82%), තෙවන තැන නැගෙනහිර පළාතෙන්ද (87.02%) වාර්තා වී ඇත. එසේම අඩුම සභික වර්ධනය උතුරු පළාතේ (80.15%) සිදු වී ඇත.

**සමානුපාත හා මිශ්‍ර මැතිවරණ ක්‍රම යටතේ ආයතන වර්ගය අනුව සභික සංඛ්‍යාවේ වර්ධනය**

| ආයතන කාණ්ඩය Type of LA | 2017 දක්වා සභික සංඛ්‍යාව Number of Councilors up to 2017 | 2018 සිට සභික සංඛ්‍යාව (අතිරේක සභිකයන් හැර) Number of Councilors from 2018(except additional Councilors) | වැඩි වීම Increase (%) | අතිරේක සභික සංඛ්‍යාව Additional Councilors |
|---|---|---|---|---|
| මහා නගර සභා(MCs) | 449 | 811 | 124.03 % | 34 |
| නගර සභා(UCs) | 417 | 729 | 133.65 % | 36 |
| ප්‍රාදේශීය සභා(PSs) | 3,627 | 6,816 | 113.73 % | 314 |
| | 4,493 | 8,356 | | 384 |

2017ට පෙර තත්ත්වයට සාපේක්ෂව ආයතන වර්ගය වශයෙන් අවධානය යොමුකිරීමේදී 124% ක සභික වර්ධනයක් මහා නගර සභාවල සිදු වී ඇත. එසේම, 133% ක වර්ධනයක් නගර සභාවලද, 113% ක වර්ධනයක් ප්‍රාදේශීය සභාවලද 2018න් පසුව ඇති වී තිබේ.

දිස්ත්‍රික් මට්ටමින් පළාත් පාලන සභික නියෝජනය 1988 – 2017 හා 2018 න් පසු

| දිස්ත්‍රික්කය | 1988 සිට 2017 දක්වා සභික සංඛ්‍යාව | 2018 සිට මේ දක්වා | | | | |
|---|---|---|---|---|---|---|
| | | සභික සංඛ්‍යාව (අතිරේක සභිකයන් හැර) | සංඛ්‍යාත්මකව වැඩි වීම | වැඩි වීමේ (%) | අතිරේක සභික සංඛ්‍යාව | මුළු සභික සංඛ්‍යාව |
| ගම්පහ | 354 | 688 | 334 | **94.35%** | 28 | 716 |
| කොළඹ | 295 | 543 | 248 | 84.07% | 29 | 572 |
| කුරුණෑගල | 340 | 620 | 280 | 82.35% | 38 | 658 |
| මහනුවර | 339 | 620 | 281 | 82.89% | 17 | 637 |
| කළුතර | 241 | 457 | 216 | 89.63% | 16 | 473 |
| රත්නපුර | 228 | 423 | 195 | 85.53% | 14 | 437 |
| ගාල්ල | 242 | 447 | 205 | 84.71% | 32 | 479 |
| අනුරාධපුර | 203 | 372 | 169 | 83.25% | 31 | 403 |
| කෑගල්ල | 195 | 357 | 162 | 83.08% | 12 | 369 |
| බදුල්ල | 215 | 391 | 176 | 81.86% | 9 | 400 |
| මාතර | 198 | 365 | 167 | 84.34% | 18 | 383 |
| පුත්තලම | 161 | 306 | 145 | 90.06% | 7 | 313 |
| නුවරඑළිය | 140 | 306 | 166 | **118.57%** | 8 | 314 |
| අම්පාර | 201 | 378 | 177 | 88.06% | 15 | 393 |
| හම්බන්තොට | 141 | 262 | 121 | 85.82% | 16 | 278 |
| යාපනය | 229 | 402 | 173 | 75.55% | 13 | 415 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| මාතලේ | 156 | 273 | 117 | 75.00% | 11 | 284 |
| මඩකලපුව | 128 | 238 | 110 | 85.94% | 15 | 253 |
| මොණරාගල | 104 | 198 | 94 | 90.38% | 11 | 209 |
| පොළොන්නරුව | 91 | 166 | 75 | 82.42% | 7 | 173 |
| ත්‍රිකුණාමලය | 118 | 220 | 102 | 86.44% | 13 | 233 |
| වව්නියා | 52 | 103 | 51 | **98.08%** | 11 | 114 |
| කිලිනොච්චි | 38 | 66 | 28 | 73.68% | 2 | 68 |
| මන්නාරම | 46 | 88 | 42 | 91.30% | 6 | 94 |
| මුලතිව් | 38 | 67 | 29 | 76.32% | 5 | 72 |
| **එකතුව(24)** | **4,493** | **8,356** | **3,863** | | **384** | **8740** |

**සභික නියෝජනයෙහි වැඩි වීම ප්‍රතිශතයක් වශයෙන්**

ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක ව පැවති මහා නගර සභා, නගර සභා, සුළු නගර සභා සහ ගම් සභා කොට්ඨාසවලට බෙදා වෙන් කර ඒ එක් එක් කොට්ඨාසය වෙනුවෙන් පවත්වනු ලබන ඡන්ද විමසීමක් මගින් සභිකයන් තෝරා ගැනීම සිදු කරනු ලැබ ඇත. 1977 අංක 24 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (විශේෂ විධිවිධාන) පනත මගින් මෙම ක්‍රමය සංශෝධනය කර ඒ වෙනුවට සමානුපාතික නියෝජන ක්‍රමය හඳුන්වා දෙන ලදී. රජය විසින් ප්‍රතිපත්තිමය වශයෙන් ගනු ලැබූ තීරණයකට අනුව කොට්ඨාස ක්‍රමය හා සමානුපාත නියෝජනය යන ක්‍රම දෙකම ඇතුළත් වන පරිදි පළාත් පාලන ආයතන සඳහා සභිකයන් තෝරා ගැනීම, 2012 අංක 21 දරන පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනත සහ 2012 අංක 22 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත මගින් සංශෝධනය කරන ලදී. මෙම සංශෝධන යටතේ පළාත් පාලන ආයතන සඳහා සභිකයන් තෝරා ගැනීමේ ප්‍රථම වරට ඡන්ද විමසීම 2018 පෙබරවාරි මස 10 දින පවත්වන ලදී.

1977 අංක 24 මෙම ඡන්ද විමසීමත් සමග ම පළාත් පාලන ආයතනවල සභික සංඛ්‍යාවේ ප්‍රමාණය අසීමිත ආකාරයෙන් වැඩි වීමකට භාජනය විය. නුවරඑළිය දිස්ත්‍රික්කයේ මෙම වැඩි වීම 118.57 % ක අගයක පිහිටා පළමු ස්ථානයට ද, වව්නියාව 98.08 % ක් ද, ගම්පහ 94.35 % ක් ද, මන්නාරම 91.30 % සහ මොණරාගල 90.38 % ක් ද වශයෙන් සභිකයන් වැඩි වීමෙන් පිළිවෙළින් දෙවන ස්ථානයේ සිට පස්වන ස්ථානයට පත් වී ඇත. සභික සංඛ්‍යාව වැඩි වීමේ අවම බලපෑම සැලකිල්ලට ගැනීමේ දී (අඩු ම බලපෑමේ වැඩි වීම) කිලිනොච්චිය, මාතලේ, යාපනය, මුලතිව් සහ බදුල්ල දිස්ත්‍රික්කවලට

පිළිවෙළින් හිමි වේ. ප්‍රතිශතයක් වශයෙන් ගත් කළ එය පිළිවෙළින් 73.68 %, 75.00 %, 75.55 %, 76.32 සහ 81.86 % යන අගයන් හිමි කර ගෙන ඇත. ලියා පදිංචි ඡන්ද දායකයන්ගේ ප්‍රමාණය කලින් වර්ෂයට වඩා ඊළඟ වර්ෂයේ දී ඉහළ යාම සාමාන්‍ය තත්ත්වයකි. දිස්ත්‍රික්කයක ලියා පදිංචි ඡන්ද දායකයන්ගේ ප්‍රමාණය අනුව එම දිස්ත්‍රික්කයේ සභික සංඛ්‍යාව වැඩි වීමක් විය හැකි යයි උපකල්පනය කළ හැකි තත්ත්වයක් ඇතත් 2018 වර්ෂයේ ලියා පදිංචි ඡන්ද සංඛ්‍යාව සැලකිල්ලට ගැනීමේ දී වැඩි ම අගයක් (1,724,309) පෙන්වන්නේ ගම්පහ දිස්ත්‍රික්කයේ වුව ද සභිකයන් වැඩි වීමේ අනුපිළිවෙළ අනුව ගම්පහ දිස්ත්රික්කයට හිමි වන්නේ 3 වන ස්ථානය යි. සභික සංඛ්‍යාව වැඩි වීමේ ප්‍රතිශතය ඉහළින් ම පවතින නුවරඑළිය දිස්ත්‍රික්කයේ ලියා පදිංචි ඡන්ද දායක සංඛ්‍යාව වන්නේ 562,025 කි. සභික සංඛ්‍යාවේ වැඩි වීම අඩුවෙන් ම පෙන්නුම් කරන කිලිනොච්චි දිස්ත්‍රික්කයේ ලියා පදිංචි ඡන්ද ගණන 86,734 කි.

මෙම බලපෑම පළාත් වශයෙන් සැළකිල්ලට ගැනීමේ දී, වැඩි ම බලපෑමක් පෙන්නුම් කරන්නේ 89.66 % ක ප්‍රතිශතයක් සහිත ව බස්නාහිර පළාතෙනි. මධ්‍යම පළාත හා නැගෙනහිර පළාත පිළිවෙළින් 88.82 % ක හා 87.02 % ක ප්‍රතිශතයක් හිමි කර ගනිමින් දෙවන හා තුන්වන මට්ටමේ බලපෑමකට ලක් වී ඇත. 2018 වර්ෂයේ දී බස්නාහිර පළාතේ සහ මධ්‍යම පළාතේ ලියා පදිංචි ඡන්දදායකයන් සංඛ්‍යාව පිළිවෙළින් 4,318,542 හා 2,063,141 යන අගයන් සැළකිල්ලට ගත් කළ මෙවැනි බලපෑමකට ඉඩකඩ තිබිය හැකි යයි උපකල්පනය කළ හැකි වුව ද, නැගෙනහිර පළාතේ ලියා පදිංචි ඡන්ද දායකයන් ගණන 1,155,639 ක් වන නමුත් 1,973,504 ක් හා 1,903,398 ක් වූ පිළිවෙළින් වන දකුණ සහ වයඹ පළාත් වෙනුවෙන් වන බලපෑම 4 වන හා 5 වන ස්ථානයට පැමිණ ඇත.

**සංඛ්‍යාත්මකව සභිකයින් වැඩිවීම : 1988 – 2017 හා 2018 න් පසු**

බස්නාහිර පළාතේ සංඛ්‍යාත්මකව සභික වැඩිවීමේ ස්වභාවය පිළිබඳ අවධානය යොමු කිරීමේදී, 1988 දී ගම්පහ දිස්ත්‍රික්කය නියෝජනය කළ 354 ක් වූ සභික සංඛ්‍යාව 2018 දී, 716 දක්වා සභිකයින් 362 කින් වැඩි වී ඇති අතර, 295 ක්ව පැවති කොළඹ දිස්ත්‍රික්කය නියෝජනය කළ සභික සංඛ්‍යාව 572 දක්වා 277 කින් ද, 241ක්ව පැවති කළුතර දිස්ත්‍රික්කය නියෝජනය කළ සභික සංඛ්‍යාව 473 දක්වා 232 කින් ද වැඩි වී තිබේ.

ඒ අනුව 1988 දී 890 ක්ව පැවති බස්නාහිර පළාතේ මුළු සභික සංඛ්‍යාව 2018 න් පසු 1761 දක්වා වැඩිවී ඇති අතර, එය බස්නාහිර පළාතේ සමස්ථ සභික සංඛ්‍යාවේ 871ක වර්ධනයක් පෙන්නුම් කරයි.

මධ්‍යම පළාත පිළිබඳ අවධානය යොමු කිරීමේදී, 1988 දී 140 ක් වූ නුවරඑළිය දිස්ත්‍රික්කයේ සභික සංඛ්‍යාව 2018 දී 314 දක්වා 174 කුගෙන් වැඩි වී ඇති අතර, 339 ක්ව පැවති මහනුවර දිස්ත්‍රික්කය නියෝජනය කළ සභික සංඛ්‍යාව 637 දක්වා 298 කින් ද, 156ක්ව පැවති මාතලේ දිස්ත්‍රික්කය නියෝජනය කළ සභික සංඛ්‍යාව 284 දක්වා 128 කින් ද ඉහළ ගොස් ඇත.

ඒ අනුව 1988 දී මධ්‍යම පළාතේ සිටි 635 ක් වූ සභික සංඛ්‍යාව 2018 දී 1235 දක්වා වැඩිවී ඇත. මෙය මධ්‍යම පළාතේ සභික සංඛ්‍යාවේ 600 ක වර්ධනයකි.

දකුණු පළාත පිළිබඳ අවධානය යොමු කිරීමේදී,1988 දී 242 ක් වූ ගාල්ල දිස්ත්‍රික්කයේ සභික සංඛ්‍යාව 2018 දී 479 දක්වා 237 කුගෙන් වැඩි වී ඇති අතර, 198 ක්ව පැවති මාතර දිස්ත්‍රික්කය නියෝජනය කළ සභික සංඛ්‍යාව 383 දක්වා 185කින් ද, 141ක්ව පැවති හම්බන්තොට දිස්ත්‍රික්කය නියෝජනය කළ සභික සංඛ්‍යාව 278 දක්වා 137 කින් ද වැඩි වී ඇත.

1988 දී 581 ක්ව තිබූ සභික සංඛ්‍යාව 2018 දී 1140 දක්වා වර්ධනය වීම දකුණු පළාතේ සභික සංඛ්‍යාවේ 559 ක වැඩිවීමක් පෙන්නුම් කරයි.

උතුරු මැද පළාත පිළිබඳ අවධානය යොමු කිරීමේදී, 1988 දී අනුරාධපුර දිස්ත්‍රික්කයේ 203 ක් වූ සභික සංඛ්‍යාව 2018 දී 403 දක්වා 200 දෙනෙකුගෙන් වැඩි වී ඇති අතර, 91ක්ව පැවති පොළොන්නරුව දිස්ත්‍රික්කය නියෝජනය කළ සභික සංඛ්‍යාව 173 දක්වා 82 කින් ද වැඩි වී ඇත.

1988 දී 294 ක්ව තිබූ සභික සංඛ්‍යාව 2018 දී 576 දක්වා වර්ධනය වීම උතුරු මැද පළාතේ සභික සංඛ්‍යාවේ 282 ක වැඩිවීමකි.

සබරගමුව පළාත පිළිබඳව අවධානය යොමු කිරීමේදී, 1988 දී රත්නපුර දිස්ත්‍රික්කයේ 228 ක් වූ සභික සංඛ්‍යාව 2018 දී 437 දක්වා 209 දෙනෙකුගෙන් වැඩි වී ඇති අතර, 195ක්ව පැවති කෑගල්ල දිස්ත්‍රික්කය නියෝජනය කළ සභික සංඛ්‍යාව 369 දක්වා 174 කින් ද වැඩි වී ඇත.

1988 දී 423 ක්ව තිබූ සභික සංඛ්‍යාව 2018 දී 806 දක්වා වර්ධනය වීම සබරගමුව පළාතේ සභික සංඛ්‍යාවේ 383 ක වැඩිවීමකි.

ඌව පළාත පිළිබඳ අවධානය යොමු කිරීමේදී, 1988 දී බදුල්ල දිස්ත්‍රික්කයේ 215 ක් වූ සභික සංඛ්‍යාව 2018 දී 400 දක්වා 185 දෙනෙකුගෙන් වැඩි වී ඇති අතර, 104 ක්ව පැවති මොණරාගල දිස්ත්‍රික්කය නියෝජනය කළ සභික සංඛ්‍යාව 209 දක්වා 105 කින් ද වැඩි වී ඇත.

මෙලෙස 1988 දී 319 ක්ව තිබූ සභික සංඛ්‍යාව 2018 දී 609 දක්වා වර්ධනය වීම ඌව පළාතේ සමස්ථ සභික සංඛ්‍යාවේ 290 ක වැඩිවීමක් පෙන්නුම් කරයි.

වයඹ පළාත පිළිබඳ අවධානය යොමු කිරීමේදී, 1988 දී පුත්තලම දිස්ත්‍රික්කයේ 161ක් වූ සභික සංඛ්‍යාව 2018 දී 313 දක්වා 152 දෙනෙකුගෙන් වැඩි වී ඇති අතර, 340 ක්ව පැවති කුරුණෑගල දිස්ත්‍රික්කය නියෝජනය කළ සභික සංඛ්‍යාව 658 දක්වා 318 කින් ද වැඩි වී ඇත.

1988 දී 501 ක්ව තිබූ සභික සංඛ්‍යාව 2018 දී 971 දක්වා වර්ධනය වීම වයඹ පළාතේ සභික සංඛ්‍යාවේ 470 ක වැඩිවීමකි.

නැගෙනහිර පළාත පිළිබඳ අවධානය යොමු කිරීමේදී, 1988 දී අම්පාර දිස්ත්‍රික්කයේ 201 ක් වූ සභික සංඛ්‍යාව 2018 දී 393 දක්වා 192 කුගෙන් වැඩි වී ඇති අතර, 128 ක්ව පැවති මඩකළපුව දිස්ත්‍රික්කය නියෝජනය කළ සභික සංඛ්‍යාව 253 දක්වා 125 කින් ද, 118 ක්ව පැවති ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය නියෝජනය කළ සභික සංඛ්‍යාව 233 දක්වා 115 කින් ද වැඩි වී ඇත.

1988 දී 447ක්ව තිබූ සභික සංඛ්‍යාව 2018 දී 879 දක්වා වර්ධනය වීම නැගෙනහිර පළාතේ සභික සංඛ්‍යාවේ 432 ක වැඩිවීමකි.

උතුරු පළාත පිළිබඳ අවධානය යොමු කිරීමේදී, 1988 දී යාපනය දිස්ත්‍රික්කයේ 229 ක් වූ සභික සංඛ්‍යාව 2018 දී 415 දක්වා 186 දෙනෙකුගෙන් වැඩි වී ඇති අතර, 52 ක්ව පැවති වවුනියා දිස්ත්‍රික්කය නියෝජනය කළ සභික සංඛ්‍යාව 114 දක්වා 62 කින් ද, 38 ක්ව පැවති කිළිනොච්චි දිස්ත්‍රික්කය නියෝජනය කළ සභික සංඛ්‍යාව 68 දක්වා 30 කින් ද, 38ක්ව පැවති මුලතිව් දිස්ත්‍රික්කය නියෝජනය කළ සභික සංඛ්‍යාව 72 දක්වා 24 කින් ද, 46 ක්ව පැවති මන්නාරම් දිස්ත්‍රික්කය නියෝජනය කළ සභික සංඛ්‍යාව 94 දක්වා 48 කින් ද, වැඩි වී ඇත.

1988 දී 403 ක්ව තිබූ සභික සංඛ්‍යාව 2018 දී 763 දක්වා වර්ධනය වීම උතුරු පළාතේ සභික සංඛ්‍යාවේ 360 ක වැඩිවීමක් පෙන්නුම් කරයි.

ඒ අනුව 1988 දී 4493 ක්ව තිබූ පළාත් පාලන ආයතනවල සභික සංඛ්‍යාව 2018 න් පසුව 8740 දක්වා වැඩිවීම සභිකයින් 4247 දෙනෙකුගේ වර්ධනයක් පෙන්නුම් කරයි. මෙය 1988 දී මෙරට පළාත් පාලන ආයතන නියෝජනය කළ මහජන නියෝජිතයින් ප්‍රමාණය දෙගුණ වීමකි.

ඉහත විස්තරාත්මකව සාකච්ඡා කොට ඇති කරුණු කාරණා පිළිබඳව අවධානය යොමු කිරීමෙන් වරින් වර බලයට පත් රජයන් විසින් පළාත් පාලන ආයතනවල ව්‍යුහයන්හි සිදු කරන ලද වෙනස්කම්වල බලපෑම පිළිබඳව අවබෝධ කර ගත හැකිවනු ඇත.

එසේම පළාත් පාලන ආයතන සභිකයින් තෝරාගැනීම සඳහා උපයෝගී කරගනු ලැබ ඇති මැතිවරණ ක්‍රමවේදයන් සභික සංඛ්‍යාවේ විචලනය වීමට බලපා ඇති ආකාරයද මෙමගින් අනාවරණය වේ. මෙලෙස විටින් විට බලයට පත් රජයන් විසින් ගන්නා ලද ප්‍රතිපත්තිමය තීරණ මත පළාත් පාලන ආයතනවල ස්වරූපයන් හා සංඛ්‍යාත්මක නියෝජනයේ සිදුව ඇති උච්චාවචනය වීම පිළිබඳව තොරතුරු මෙම විශ්ලේෂණය මඟින් පැහැදිලි කරගත හැකි වේ.

**1989 න් පසු පළාත් පාලන ආයතන සභිකයින් සඳහා මාසික දීමනා ගෙවීම් ආරම්භය**

මාසික දීමනා ගෙවීම් හිමිකම්වලින් තොරව ගරු සේවයක් සේ සළකා පළාත් පාලන ආයතනවල සභිකයින් ඉටුකරන ලද සේවාව වෙනුවෙන් අමාත්‍ය මණ්ඩල තීරණයක් පදනම්ව 1989 ජනවාරි සිට මාසික දීමනා ගෙවීම ආරම්භ කොට ඇත.

ඒ අනුව පළාත් පාලන ආයතන සභිකයින් සඳහා 1989 සිට කාණ්ඩ අනුව අදාළ කොට ඇති මාසික දීමනා පහත පරිදි වේ.

| කාණ්ඩය Category | *මාසික දීමනාව (රු.) Monthly Allowance (Rs.) |
|---|---|
| නගරාධිපති | 12,450.00 |
| නියෝජ්‍ය නගරාධිපති | 8,200.00 |
| මහා නගර සභා සභික | 5,750.00 බැගින් |
| නගර සභා හෝ ප්‍රාදේශීය සභා සභාපති | 7,900.00 |
| නගර සභා හෝ ප්‍රාදේශීය සභා උප සභාපති | 4,275.00 |
| නගර සභා හෝ ප්‍රාදේශීය සභා සභික | 3,095.00 බැගින් |

සටහන: * මාසික ගමන් වියදම් දීමනා, දුරකථන දීමනා සහ කමිටුවලට සහභාගී වීම වෙනුවෙන් සහභාගිත්ව දීමනා මීට ඇතුළත් නොවේ.

ඒ අනුව නගරාධිපතිවරුන්, නියෝජ්‍ය නගරාධිපතිවරුන්, සභාපතිවරුන්, උප සභාපතිවරුන් හා සභිකයින් සඳහා ඉහත පරිදි මාසික දීමනා හා වෙනත් දීමනාද ගෙවීම ආරම්භ වීමත් සමඟම පළාත් පාලන ආයතන නියෝජිතයින් උදෙසා වාර්ෂික ප්‍රතිපාදන වෙන් කිරීම මඟින් අමතර පිරිවැය දැරීමට රජයට සිදු වී ඇත.

**වත්මන් පළාත් පාලන ආයතන සභිකයින් සඳහා අදාළ මාසික දීමනා:**

| කාණ්ඩය Category | *මාසික දීමනාව(රු.) Monthly Allowance(Rs.) |
|---|---|
| නගරාධිපති | 30,000.00 |
| නියෝජ්‍ය නගරාධිපති | 25,000.00 |
| මහා නගර සභා සභික | 20,000.00 බැගින් |
| නගර සභා හෝ ප්‍රාදේශීය සභා සභාපති | 25,000.00 |
| නගර සභා හෝ ප්‍රාදේශීය සභා උප සභාපති | 20,000.00 |
| නගර සභා හෝ ප්‍රාදේශීය සභා සභික | 15,000.00 බැගින් |

සටහන: * මාසික ගමන් වියදම් දීමනා, දුරකථන දීමනා සහ කමිටුවලට සහභාගී වීම වෙනුවෙන් සහභාගිත්ව දීමනා මීට ඇතුළත් නොවේ.

ඉහත තොරතුරු පරීක්ෂා කිරීමේදී, මාසික සභික දීමනා ගෙවීම් ආරම්භයේදී රු. 12,450.00 ක්ව පැවති මාසික නගරාධිපති දීමනාව වර්තමානයේ රු. 30,000.00 දක්වා වැඩිවී ඇත. එසේම මාසික නියෝජ්‍ය නගරාධිපති දීමනාවද රු. 8,200.00 සිට වර්තමානයේ රු. 25,000.00 දක්වා වැඩිවී ඇත. තවද, රු. 5,750.00 බැගින් වූ මහා නගර සභා සභික දීමනාවද වර්තමානයේ රු. 20,000.00 දක්වා ඉහළ ගොස් ඇත.

තවද, නගර සභා හා ප්‍රාදේශීය සභා සභාපති තනතුරු සඳහා ආරම්භයේ රු. 7,900.00 ක්වූ මාසික දීමනාව මේ වනවිට රු. 25,000.00 දක්වා වැඩි වී ඇත. එමෙන්ම නගර සභා හා ප්‍රාදේශීය සභා උප සභාපති තනතුරු සඳහා ආරම්භයේ රු. 4,275.00 ක් වූ මාසික දීමනාව මේ වනවිට රු. 20,000.00 දක්වාත් වැඩි වී ඇත.එසේම රු. 3,095.00 බැගින් වූ නගර සභා හෝ ප්‍රාදේශීය සභා මාසික සභික දීමනාව රු. 15,000.00 දක්වා ඉහළගොස් ඇත.

ඉහත තොරතුරු පිළිබඳ අවධානය යොමුකිරීමෙන් පළාත් පාලන ආයතනවල මහජන නියෝජිතයින් උදෙසා 1989 සිට ඇරඹි මාසික සභික දීමනා ගෙවීම විකාශනය වී ඇති ආකාරය අවබෝධ කරගත හැකි වනු ඇත.

**සභිකයින් සඳහා වූ සභික දීමනා (ආයතන වර්ගය හා කාණ්ඩය අනුව)**

මෙරටට ප්‍රාදේශීය සභා හඳුන්වාදීමත් සමඟ සෑම කාණ්ඩයක ම පළාත් පාලන ආයතන සභිකයන්ට මාසික දීමනාවක් ගෙවීමට රජය ප්‍රතිපත්තිමය වශයෙන් තීරණය කිරීමත් සමගම ඔවුන්ට ගෙවිය යුතු මාසික දීමනාව පිළිබඳ නියෝග / රීති, පළාත් සභාවල පළාත් පාලන අමාත්‍යවරුන් විසින් ගැසට් මගින් නිවේදනය කරනු ලැබ ඇත. කලින් කළ මෙම මාසික දීමනාවේ අගය සංශෝධනය කර ඇත. මේ යටතේ පළාත් පාලන ආයතනවල සභිකයන් සඳහා දැනට ගෙවනු ලබන දීමනාව පහත සඳහන් පරිදි වේ.

**මහා නගර සභා (MCs)**

| කාණ්ඩය<br>**Category** | මාසික දීමනාව(රු.)<br>**Monthly Allowance(Rs.)** |
|---|---|
| නගරාධිපති (Mayor) | 30,000.00 |
| නියෝජ්‍ය නගරාධිපති (Deputy Mayor) | 25,000.00 |
| සභිකයන් (Councilor) | 20,000.00 බැගින් |

**නගර සභා සහ ප්‍රාදේශීය සභා (UCs & PSs)**

| කාණ්ඩය<br>**Category** | මාසිකදීමනාව(රු.)<br>**Monthly Allowance(Rs.)** |
|---|---|
| සභාපති (Chairman) | 25,000.00 |
| උප සභාපති (Vice Chairman) | 20,000.00 |
| සභිකයන් (Councilor) | 15,000.00 බැගින් |

ඉහත පරිදි පළාත් පාලන ආයතනවල සභිකයින් සඳහා මාසික දීමනා ගෙවීම ආරම්භවීමෙන් පසුව 2017 දක්වා හා 2018න් පසු සභිකයින් සඳහා වූ දීමනා ගෙවීම වැඩිවී ඇති ආකාරය පහත වගුව පිරික්සීම තුළින් අවබෝධ කරගත හැකිවනු ඇත.

**මාසික සහික දීමනා වැඩි වීම දිස්ත්‍රික් මට්ටමෙන්**

| පළාත | දිස්ත්‍රික්කය | 2017 දක්වා මාසික සහික දීමනාව | 2018 සිට මාසික සහික දීමනාව (අතිරේක සහිකයන් ඇතුළුව) | වැඩි වීම (%) |
|---|---|---|---|---|
| බස්නාහිර | කොළඹ | 5,415,000 | 10,280,000 | 89.84 % |
| | ගම්පහ | 5,815,000 | 11,415,000 | **96.30 %** |
| | කළුතර | 3,870,000 | 7,350,000 | 89.92 % |
| මධ්‍යම | මහනුවර | 5,535,000 | 10,090,000 | 82.29 % |
| | මාතලේ | 2,675,000 | 4,675,000 | 74.77 % |
| | නුවරඑළිය | 2,330,000 | 5,005,000 | **114.81 %** |
| දකුණ | ගාල්ල | 4,025,000 | 7,660,000 | 90.31 % |
| | මාතර | 3,290,000 | 6,150,000 | 86.93 % |
| | හම්බන්තොට | 2,355,000 | 4,455,000 | 89.17 % |
| උතුර | යාපනය | 3,805,000 | 6,705,000 | 76.22 % |
| | කිලිනොච්චි | 615,000 | 1,065,000 | 73.17 % |
| | මන්නාරම | 765,000 | 1,485,000 | 94.12 % |
| | වව්නියා | 855,000 | 1,785,000 | **108.77 %** |
| | මුලතිව් | 630,000 | 1,140,000 | 80.95 % |
| නැගෙනහිර | මඩකලපුව | 2,195,000 | 4,165,000 | 89.75 % |
| | අම්පාර | 3,455,000 | 6,500,000 | 88.13 % |
| | ත්‍රිකුණාමලය | 1,965,000 | 3,690,000 | 87.79 % |
| වයඹ | කුරුණෑගල | 5,475,000 | 10,290,000 | 87.95 % |
| | පුත්තලම | 2,595,000 | 4,875,000 | 87.86 % |
| උතුරු මැද | අනුරාධපුර | 3,395,000 | 6,475,000 | 90.72 % |
| | පොළොන්නරුව | 1,515,000 | 2,770,000 | 82.84 % |
| ඌව | බදුල්ල | 3,615,000 | 6,480,000 | 79.25 % |
| | මොණරාගල | 1,710,000 | 3,285,000 | 92.11 % |
| සබරගමුව | රත්නපුර | 3,750,000 | 6,935,000 | 84.93 % |
| | කෑගල්ල | 3,105,000 | 5,715,000 | 84.06 % |
| | | 74,755,000 | 140,440,000 | |

මාසික සහික දීමනා ප්‍රතිශතය වැඩිවීම දිස්ත්‍රික්ක වශයෙන් සැළකීමේදී , නුවරඑළිය දිස්ත්‍රික්කය(114.81%) පළමු ස්ථානයද, වවුනියා දිස්ත්‍රික්කය(108.77%) දෙවන ස්ථානයද, ගම්පහ දිස්ත්‍රික්කය(96.30%) තෙවන ස්ථානයද වාර්තා කොට ඇත.

**මාසික සභික දීමනා වැඩි වීම පළාත් මට්ටමෙන්**

| පළාත | 2017 දක්වා මාසික සභික දීමනාව | 2018 සිට මාසික සභික දීමනාව (අතිරේක සභිකයන් ඇතුළුව) | වැඩි වීම (%) |
|---|---|---|---|
| බස්නාහිර | 15,100,000 | 29,045,000 | **92.35 %** |
| මධ්‍යම | 10,540,000 | 19,770,000 | 87.57 % |
| දකුණ | 9,670,000 | 18,265,000 | **88.88 %** |
| උතුර | 6,670,000 | 12,180,000 | 82.61 % |
| නැගෙනහිර | 7,615,000 | 14,355,000 | **88.51 %** |
| වයඹ | 8,070,000 | 15,165,000 | 87.92 % |
| උතුරු මැද | 4,910,000 | 9,245,000 | 88.29 % |
| ඌව | 5,325,000 | 9,765,000 | 83.38 % |
| සබරගමුව | 6,855,000 | 12,650,000 | 84.54 % |
| | 74,755,000 | 140,440,000 | |

මාසික සභික දීමනා ප්‍රතිශතය වැඩිවීම පළාත් වශයෙන් සැළකීමේදී, බස්නාහිර පළාත පළමු ස්ථානයටද(92.35%), දකුණු පළාත දෙවන ස්ථානයටද(88.51%), නැගෙනහිර පළාත තෙවන ස්ථානයටද(88.51%) පත්වී ඇත.

**මාසික සභික දීමනා වැඩි වීම ආයතන කාණ්ඩ මට්ටමෙන්**

| ආයතන කාණ්ඩය | 2017 දක්වා මාසික සභික දීමනාව | 2018 සිට මාසික සභික දීමනාව (අතිරේක සභිකයන් ඇතුළුව) | වැඩි වීම (%) |
|---|---|---|---|
| මහා නගර සභා (MCs) | 9,340,000 | 17,260,000 | 84.80 % |
| නගර සභා(UCs) | 6,870,000 | 5,220,000 | 75.98 % |
| ප්‍රාදේශීය සභා(PSs) | 58,545,000 | 52,545,000 | 89.75 % |
| | 74,755,000 | 140,440,000 | |

ඉහත පරිදි 2017 දක්වා හා 2018 සිට දීමනා ගෙවීම වැඩිවීමේ ප්‍රතිශතය පිළිබඳව අවධානය යොමුකිරීමේදී මහා නගර සභා සම්බන්ධයෙන් 84%ක වර්ධනයක්ද, නගර සභා සම්බධයෙන් 75%ක වර්ධනයක්ද, ප්‍රාදේශීය සභා සම්බන්ධයෙන් 89%ක්ද පෙන්නුම් කරයි.

**පළාත් වශයෙන් මාසික සභික දීමනා ගෙවීමේ වියදම් සංසන්දනය -1988-2017 හා 2018 සිට**

| පළාත | 2017 දක්වා සභික දීමනා මාසික වියදම (රු.) | 2018 සිට සභික දීමනා මාසික වියදම (රු.) | දීමනා වැඩි වීම (සංඛ්‍යාත්මක) (රු.) | දීමනා වැඩි වීමේ (%) |
|---|---|---|---|---|
| බස්නාහිර | 15,100,000 | 29,045,000 | 13,945,000 | 92.35% |
| මධ්‍යම | 10,540,000 | 19,770,000 | 9,230,000 | 87.57% |
| දකුණ | 9,670,000 | 18,265,000 | 8,595,000 | 88.88% |
| උතුර | 6,670,000 | 12,180,000 | 5,510,000 | 82.61% |
| නැගෙනහිර | 7,615,000 | 14,355,000 | 6,740,000 | 88.51% |
| වයඹ | 8,070,000 | 15,165,000 | 7,095,000 | 87.92% |
| උතුරු මැද | 4,910,000 | 9,245,000 | 4,335,000 | 88.29% |
| ඌව | 5,325,000 | 9,765,000 | 4,440,000 | 83.38% |
| සබරගමුව | 6,855,000 | 12,650,000 | 5,795,000 | 84.54% |
| **එකතුව** | **74,755,000** | **140,440,000** | **65,685,000** | |

එක් එක් පළාත්වල පිහිටි පළාත් පාලන ආයතන සඳහා නියෝජිත සංඛ්‍යාව 2018 සිට වැඩිවීමෙන් පසු මාසික සභික දීමනා ගෙවීමට පළාත් මට්ටමින් සභාවලට දැරීමට සිදුව තිබෙන පිරිවැය පිළිබඳ ඉහත තොරතුරු පහත පරිදි විග්‍රහ කළ හැක.

සභිකයින් සඳහා දීමනා ගෙවීමට 2017 දක්වා බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතන රු. 15,100,000 ක් වැය කොට ඇති අතර, එම සංඛ්‍යාව 2018 සිට රු. 29,045,000 දක්වා රු 13,945,000 කින් වැඩි වී ඇති අතර, එය 2017 ට වඩා 92.35% ක වර්ධනයක් පෙන්නුම් කරයි..

සභිකයින් සඳහා දීමනා ගෙවීමට මධ්‍යම පළාතේ පළාත් පාලන ආයතන 2017 දක්වා රු. 10,540,000 ක් වැය කොට ඇති අතර, එය 2018 සිට රු. 19,770,000 දක්වා රු.8,595,000 කින් වැඩිවීම 88.88%ක වර්ධනයක් පෙන්නුම් කරයි.

සභිකයින් සඳහා දීමනා ගෙවීමට දකුණු පළාතේ පළාත් පාලන ආයතන 2017 දක්වා රු. 9,670,000 ක් වැය කොට ඇති අතර, එය 2018 සිට රු.18,265,000 දක්වා රු.9,230,000 කින් වැඩිවීම 87.57%ක වර්ධනයක් පෙන්නුම් කරයි.

සභිකයින් සඳහා දීමනා ගෙවීමට උතුරු පළාතේ පළාත් පාලන ආයතන 2017 දක්වා රු. 6,670,000 ක් වැය කොට ඇති අතර, එය 2018 සිට රු. 12,180,000 දක්වා රු. 5,510,000 දක්වා වැඩිවීම 82.61% ක වර්ධනයක් පෙන්නුම් කරයි.

සභිකයින් සඳහා දීමනා ගෙවීමට නැගෙනහිර පළාතේ පළාත් පාලන ආයතන 2017 දක්වා රු.7,615,000 ක් වැය කොට ඇති අතර, එය 2018 සිට රු. 14,355,000 දක්වා රු. 6,740,000 දක්වා වැඩිවීම 88.51% ක වර්ධනයක් පෙන්නුම් කරයි.

සභිකයින් සඳහා දීමනා ගෙවීමට වයඹ පළාතේ පළාත් පාලන ආයතන 2017 දක්වා රු. 8,070,000 ක් වැය කොට ඇති අතර, එය 2018 සිට රු. 15,165,000 දක්වා රු. 7,095,000 දක්වා වැඩිවීම 87.92%ක වර්ධනයක් පෙන්නුම් කරයි.

සභිකයින් සඳහා දීමනා ගෙවීමට උතුරු මැද පළාතේ පළාත් පාලන ආයතන 2017 දක්වා රු. 4,910,000 ක් වැය කොට ඇති අතර, එය 2018 සිට රු.9,245,000 දක්වා රු. 4,335,000 දක්වා වැඩිවීම 88.29% ක වර්ධනයක් පෙන්නුම් කරයි.

සභිකයින් සඳහා දීමනා ගෙවීමට ඌව පළාතේ පළාත් පාලන ආයතන 2017 දක්වා රු. 5,325,000 ක් වැය කොට ඇති අතර, එය 2018 සිට රු.9,765,000 දක්වා රු. 4,440,000 දක්වා වැඩිවීම 83.38%ක වර්ධනයක් පෙන්නුම් කරයි.

සභිකයින් සඳහා දීමනා ගෙවීමට සබරගමුව පළාතේ පළාත් පාලන ආයතන 2017 දක්වා රු. 6,855,000 ක් වැය කොට ඇති අතර, එය 2018 සිට රු. 12,650,000 දක්වා රු.5,795,000 දක්වා වැඩිවීම 84.54% ක වර්ධනයක් පෙන්නුම් කරයි.

පළාත් වශයෙන් සලකා බැලීමේදී මාසික සභික දීමනා ගෙවීමට අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදනවල වැඩිම වැඩිවීම බස්නාහිර පළාතෙන් වාර්තාවන අතර, එය 2017 දක්වා තිබූ වියදම 92% කින් වර්ධනය වීමට බලපා ඇත.

මාසික සභික දීමනා ගෙවීමට අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදනවල දෙවන වැඩිම වැඩිවීම දකුණු පළාතෙන් වාර්තාවන අතර, එය 2017 දක්වා තිබූ වියදම 88.88% කින් වර්ධනය වීමට බලපා ඇත.

මාසික සභික දීමනා ගෙවීමට අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදනවල තෙවන වැඩිම වැඩිවීම නැගෙනහිර පළාතෙන් වාර්තාවන අතර, එය 2017 දක්වා තිබූ වියදම 88.51% කින් වර්ධනය වීමට බලපා ඇත.

**සහික දීමනා සඳහා මාසික වියදම් දිස්ත්‍රික්ක මට්ටමින් සංසන්දනය (සංඛ්‍යාත්මක හා ප්‍රතිශත වශයෙන්) 1988 – 2017 හා 2018 න් පසු**

| දිස්ත්‍රික්කය | 2017 දක්වා සහික දීමනා මාසික වියදම (රු.) | 2018 සිට සහික දීමනා මාසික වියදම (රු.) | දීමනා වැඩි වීම (සංඛ්‍යාත්මක) (රු.) | දීමනා වැඩි වීමේ (%) |
|---|---|---|---|---|
| ගම්පහ | 5,815,000 | 11,415,000 | 5,600,000 | **96.30%** |
| කොළඹ | 5,415,000 | 10,280,000 | 4,865,000 | 89.84% |
| කුරුණෑගල | 5,475,000 | 10,290,000 | 4,815,000 | 87.95% |
| මහනුවර | 5,535,000 | 10,090,000 | 4,555,000 | 82.29% |
| කළුතර | 3,870,000 | 7,350,000 | 3,480,000 | 89.92% |
| රත්නපුර | 3,750,000 | 6,935,000 | 3,185,000 | 84.93% |
| ගාල්ල | 4,025,000 | 7,660,000 | 3,635,000 | 90.31% |
| අනුරාධපුර | 3,395,000 | 6,475,000 | 3,080,000 | 90.72% |
| කෑගල්ල | 3,105,000 | 5,715,000 | 2,610,000 | 84.06% |
| බදුල්ල | 3,615,000 | 6,480,000 | 2,865,000 | 79.25% |
| මාතර | 3,290,000 | 6,150,000 | 2,860,000 | 86.93% |
| පුත්තලම | 2,595,000 | 4,875,000 | 2,280,000 | 87.86% |
| නුවරඑළිය | 2,330,000 | 5,005,000 | 2,675,000 | **114.81%** |
| අම්පාර | 3,455,000 | 6,500,000 | 3,045,000 | 88.13% |

| | | | | |
|---|---|---|---|---|
| හම්බන්තොට | 2,355,000 | 4,455,000 | 2,100,000 | 89.17% |
| යාපනය | 3,805,000 | 6,705,000 | 2,900,000 | 76.22% |
| මාතලේ | 2,675,000 | 4,675,000 | 2,000,000 | 74.77% |
| මඩකලපුව | 2,195,000 | 4,165,000 | 1,970,000 | 89.75% |
| මොණරාගල | 1,710,000 | 3,285,000 | 1,575,000 | 92.11% |
| පොළොන්නරුව | 1,515,000 | 2,770,000 | 1,255,000 | 82.84% |
| ත්‍රිකුණාමලය | 1,965,000 | 3,690,000 | 1,725,000 | 87.79% |
| වව්නියා | 855,000 | 1,785,000 | 930,000 | **108.77%** |
| කිලිනොච්චි | 615,000 | 1,065,000 | 450,000 | 73.17% |
| මන්නාරම | 765,000 | 1,485,000 | 720,000 | 94.12% |
| මුලතිව් | 630,000 | 1,140,000 | 510,000 | 80.95% |

1988 -2017 කාලය තුළ රු. 2,330,000 ක්වූ නුවරඑළිය දිස්ත්‍රික්කයේ මාසික සභික වියදම 2018 සිට රු. 5,005,000 දක්වා රු. 2,675,000 කින් වැඩිවී ඇති අතර, එය 114.81% වර්ධනයක් පෙන්නුම් කරයි. මෙය දිස්ත්‍රික්ක වශයෙන් සළකා බැලීමේදී ඉහළම දිස්ත්‍රික් ප්‍රතිශතය වාර්තා කරයි.

1988 -2017 කාලය තුළ රු. 855,000 ක්වූ වවුනියා දිස්ත්‍රික්කයේ මාසික සභික වියදම 2018 සිට රු. 6,500,000 දක්වා රු. 3,045,000 කින් වැඩිවී ඇති අතර, එය 108.77% වර්ධනයක් පෙන්නුම් කරයි. මෙය දිස්ත්‍රික්ක වශයෙන් සළකා බැලීමේදී දෙවන වැඩිම දිස්ත්‍රික් ප්‍රතිශතය වාර්තා කොට ඇත.

1988 - 2017 කාලය තුළ රු. 5,815,000 ක්වූ ගම්පහ දිස්ත්‍රික්කයේ මාසික සභික වියදම 2018 සිට රු. 11,415,000 දක්වා රු. 5,600,000 කින් වැඩිවී ඇති අතර, එය 96.30% වර්ධනයක් පෙන්නුම් කරයි. මෙය දිස්ත්‍රික්ක වශයෙන් සළකා බැලීමේදී තෙවන ඉහළම දිස්ත්‍රික් ප්‍රතිශතය වාර්තා කරයි.

**පළාත් පාලන ආයතන වර්ග අනුව සභික දීමනා වැඩිවීම සංසන්දනය: (1988 - 2017 හා 2018 සිට සංඛ්‍යාත්මක හා ප්‍රතිශත වශයෙන්)**

| ආයතන වර්ගය | ආයතන ගණන | 2017 දක්වා සභික දීමනා මාසික වියදම (රු.) | 2018 සිට සභික දීමනා මාසික වියදම (රු.) | දීමනා වැඩි වීම(සංඛ්‍යාත්මක) (රු.) | දීමනා වැඩි වීමේ (%) |
|---|---|---|---|---|---|
| මහා නගර සභා | 24 | 9,340,000 | 17,260,000 | 7,920,000 | 84.80% |
| නගර සභා | 41 | 6,870,000 | 12,090,000 | 5,220,000 | 75.98% |
| ප්‍රාදේශීය සභා | 276 | 58,545,000 | 111,090,000 | 52,545,000 | 89.75% |
| **එකතුව** | **341** | **74,755,000** | **140,440,000** | **65,685,000** | |

උක්ත සටහන පිරික්සීමේදී 2017 දී මහා නගර සභා 24 ක සභිකයින් සඳහා දීමනා ගෙවීමට රු. 9,340,000 ක් වැයවී ඇති අතර, එය 2018 සිට රු. 17,260,00 ක්වා රු. 7,920,000 කින් වැඩිවී ඇති අතර,එය 2017 ට වඩා 84.80% ක වැඩිවීමකි.

නගර සභා 41 ක සභිකයින් සඳහා දීමනා ගෙවීමට 2017 දී රු. 6,870,000 ක් වැය කොට ඇති අතර, එම සංඛ්‍යාව 2018 සිට රු. 12,090,000 දක්වා රු 5,220,000 කින් වැඩි වී ඇති අතර, එය 2017 ට වඩා 75.98% ක වර්ධනයක් පෙන්නුම් කරයි.

ප්‍රාදේශීය සභා සභා 276 ක සභිකයින් සඳහා දීමනා ගෙවීමට 2017 දී රු. 58,545,000 ක් වැය කොට ඇති අතර, එය 2018 සිට රු. 111,090,000 දක්වා රු. 52,545,000 දක්වා වැඩිවීම 89.75% ක වර්ධනයක් පෙන්නුම් කරයි.

පළාත් පාලන ආයතන 341 ක(මහා නගර සභා, නගර සභා හා ප්‍රාදේශීය සභා) සභිකයින්ගේ දීමනා ගෙවීම සඳහා 2017 දක්වා රු.74,755,000 වැය කොට ඇති අතර, 2018 සිට එම සභික සංඛ්‍යාවට දීමනා ගෙවීමට රු. 140,440,000 කට වැඩි ප්‍රමාණයක් වැය වන අතර, එය 2017 සිටි සභිකයින් ප්‍රමාණයට වඩා වැඩි පිරිසකට දීමනා ගෙවීමට අමතරව රු. 65,685,000 ක් වැයකිරීමට සිදුවී ඇත.

මෙහිදී සභික දීමනා ගෙවීම උදෙසා වැඩිම ප්‍රතිශතය ප්‍රාදේශීය සභා සඳහාද(89.75%), දෙවන වැඩිම ප්‍රතිශතය මහා නගර සභා සඳහාද (84.80%), තෙවනුව නගර සභා සඳහාද (75.98%) වශයෙන් වර්ධනය වී ඇත.

සමස්ථයක් වශයෙන් පිරික්සීමේදී 2017 දක්වා මහා නගර සභා 24 කින්, නගර සභා 41 කින් හා ප්‍රාදේශීය සභා සභා 276 කින් සමන්විත පළාත් නවය(09) තුළ පිහිටි පළාත් පාලන ආයතන 341 ක සභිකයින් 4,493 කගේ මාසික සභික දීමනා ගෙවීමට රු.74,755,000ක් වැය වී ඇති අතර, එය 2018 සිට සභිකයින් 8740 කගේ මාසික දීමනා ගෙවීම සඳහා රු. 140,440,000 ක් දක්වා රු. 65,685,000 කින් වැඩිවී ඇති ආකාරය නිරීක්ෂණය වේ. මෙම තත්ත්වය මධ්‍යම රජය මඟින් පළාත් සභා හරහා පළාත් පාලන ආයතනවලට සභික දීමනා ගෙවීමට ලබාදෙන මූල්‍ය ප්‍රතිපාදනවල විශාල වැඩිවීමක් පෙන්නුම් කරයි.

මෙලෙස වැඩි වී ඇති සභිකයින් නඩත්තුකිරීම උදෙසා  ප්‍රතිපාදන වැඩි ප්‍රමාණයක් පළාත් පාලනයට ලබාදීමට සිදුවීම රජයේ වාර්ෂික ප්‍රතිපාදන වෙන්කිරීම් ඉහළ යාමට සෘජුව බලපා ඇත.

**සභිකයින් සඳහා වූ අමතර ගෙවීම්**

ඇතැම් පළාත් සභා විසින් පළාත් පාලන ආයතන සභිකයන්ට ගෙවනු ලබන ඉහත මාසික දීමනාවට අමතරව මාසික ගමන් වියදම් දීමනාවක්, දුරකථන දීමනාවක් සහ කමිටුවලට සහභාගි වීම වෙනුවෙන් සහභාගිත්ව දීමනාවක් ද ගෙවනු ලැබේ. පළාතෙන් පළාතට මෙම දීමනාවේ ප්‍රමාණය වෙනස් වන අතර, ඇතැම් දීමනා ක්‍රියාත්මක වන්නේ පළාත් සභා කිහිපයක පමණි. මෙම අධ්‍යයනය සඳහා ගණන් බැලීමේ දී එවැනි දීමනා ඇතුළත් කර නැත. දීමනා ගණනය කිරීමේ දී සැළකිල්ලට ගෙන ඇත්තේ මාසික සභික දීමනා ප්‍රමාණය පමණි.

පළාත් පාලන ආයතන සංයුතිය සංසන්දනාත්මක

<u>1981 ජූලි දක්වා</u> 1<u>981 -1987</u> <u>1988න් පසු</u>

| පළාත | ම. න. ස. | න. ස. | සු. න. ස. | ග. ස. | එකතුව | ම. න. ස. | න. ස. | දි.සං.ස. | එකතුව | ම. න. ස. | න. ස. | ප්‍ර. ස. | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| බස්නාහිර | 3 | 14 | 21 | 55 | 119 | 5 | 12 | 3 | 20 | 5 | 12 | 28 | 45 |
| මධ්‍යම | 3 | 6 | 6 | 84 | 107 | 3 | 6 | 3 | 12 | 3 | 6 | 33 | 42 |
| දකුණ | 1 | 5 | 13 | 70 | 107 | 1 | 5 | 3 | 9 | 1 | 5 | 36 | 42 |
| උතුර | 1 | 4 | 11 | 79 | 143 | 1 | 4 | 4 | 9 | 1 | 4 | 27 | 32 |
| නැගෙනහිර | 1 | 2 | 7 | 58 | 102 | 1 | 2 | 3 | 6 | 1 | 2 | 36 | 39 |
| වයඹ | 1 | 3 | 8 | 73 | 34 | 1 | 3 | 2 | 6 | 1 | 3 | 27 | 31 |
| උතුරු මැද | - | 1 | 3 | 41 | 37 | - | 1 | 2 | 3 | - | 1 | 24 | 25 |
| ඌව | 1 | 2 | 5 | 44 | 11 | 1 | 2 | 2 | 5 | 1 | 2 | 24 | 27 |
| සබරගමුව | 1 | 2 | 9 | 45 | 26 | 1 | 2 | 2 | 5 | 1 | 2 | 23 | 26 |
| **එකතුව** | **12** | **39** | **83** | **549** | **683** | 14 | 37 | 24 | 75 | **14** | **37** | **258** | 309 |

<u>සටහන:</u>

1981 ජූලි 01 දින සිට දිස්ත්‍රික් සංවර්ධන සභා (දි.සං.ස.) 24 ක් ස්ථාපිත කිරීමත් සමඟම එතෙක් ක්‍රියාත්මකව පැවති සුළු නගර සභා 83 හා ගම් සභා 549 අහෝසි වීම හේතුවෙන් සභිකයින් 7665 කගේ ධූරයන් ද අක්‍රිය කෙරිනි.

එහෙත් එම කාල සීමාවන්හි මහා නගර සභා 12 ක්, නගර සභා 39 ක්, සුළු නගර සභා 83ක් හා ගම් සභා 549ක් විශාල සභික සංඛ්‍යාවකගේ නියෝජනයක් සහිතව පැවතියද, එම සභිකයින් සඳහා දීමනා කිසිවක් ගෙවීමට සිදු නොවූයෙන් එය රටේ ආර්ථිකයට සෘජු බලපෑමක් සිදු කොට නොමැත. එයට හේතුව සභිකයින් දීමනා ලබා ගැනීමකින් තොරව තම නියෝජනය ජනතාව වෙනුවෙන් කරන ගරු සේවයක් සේ සළකා කටයුතු කිරීමය.

1981 -1987 කාලය තුළ මහා නගර සභා 14ක්, නගර සභා 37ක් සමඟ සුළු නගර සභා හා ගම් සභා 632ක් වෙනුවට ස්ථාපිත කරන ලද සංවර්ධන සභා 24 ත් සමඟ පළාත් පාලන ආයතන 75 ක් ක්‍රියාත්මක වී ඇත.

එසේම සංවර්ධන සභා අහෝසිකොට 1987 දී ප්‍රාදේශීය සභා හඳුන්වා දීමත් සමඟම මහා නගර සභා 14ක්, නගර සභා 37ක් හා ප්‍රාදේශීය සභා 258ක් වශයෙන් 309 දක්වා පළාත් පාලන ආයතන සංඛ්‍යාව වර්ධනය වී ඇත.

ගරු සේවාවක් ලෙස සළකා සභිකයන් පළාත් පාලන ආයතන නියෝජනය කිරීම වෙනුවට පසුකාලීනව මාසිකව සභික දීමනා ගෙවීම ඇරඹීමත් සමඟම ඔවුන් විසින් ජනතාව වෙනුවෙන් ඉටුකරන සේවාවන්හි ගුණාත්මක වර්ධනයක්ද නිරීක්ෂණය නොවේ.

**2018 - 2022 පළාත් පාලන ආයතන සංයුතිය***

| පළාත<br>Province | ම. න. ස. | න. ස. | ප්‍රා. ස. | එකතුව |
|---|---|---|---|---|
| බස්නාහිර | 7 | 14 | 28 | **49** |
| මධ්‍යම | 4 | 6 | 37 | **47** |
| දකුණ | 3 | 4 | 42 | **49** |
| උතුර | 1 | 5 | 29 | **35** |
| නැගෙනහිර | 3 | 5 | 37 | **45** |
| වයඹ | 1 | 3 | 29 | **33** |
| උතුරු මැද | 2 | 2 | 24 | **26** |
| ඌව | 2 | 1 | 25 | **28** |
| සබරගමුව | 1 | 3 | 25 | **29** |
| **එකතුව** | **24** | **41** | **276** | **341** |

<u>සටහන :</u> *දැනට නගර සභා වශයෙන් ක්‍රියාත්මක වන නැගෙනහිර පළාතේ ත්‍රිකුණාමලය හා අම්පාර මහා නගර සභා බවට හා සබරගමුව පළාතේ කෑගල්ල නගර සභාව මහා නගර සභාවක් බවටද, තවත් හඳුනාගත් නගර සභා හා ප්‍රාදේශීය සභා කිහිපයක්ද උත් ශ්‍රේණිගත කිරීමට ද නිර්දේශ වී ඇත. ඒ අනුව ඉදිරියේදී පළාත් පාලන ආයතනවල දැනට පවතින ඉහත සංයුතියෙහි වෙනස්කම් සිදුවනු ඇත.

1988 -2018 හා 2018 -2022 පළාත් පාලන ආයතන සංඛ්‍යාව පරීක්ෂා කිරීමේදී සෑම පළාතකම පැවති ආයතන සංඛ්‍යාව වර්ධනය වී ඇති බව නිරීක්ෂණය වේ.

ඒ අනුව 2018 ට පෙර 45 ක්ව පැවති බස්නාහිර පළාතේ පළාත පාලන ආයතන සංඛ්‍යාව 2018 න් පසුව 49 දක්වා 04 කින් වැඩිවී ඇත. එසේම මධ්‍යම පළාතේ 42 ක් වූ එම ආයතන සංඛ්‍යාව 47 දක්වා ආයතන 05 කින් වැඩි වීමක් පෙන්නුම් කරයි.

තවද, දකුණු පළාතේ 42 ක්ව පැවති ආයතන ගණන 49 දක්වා 07 කින් වැඩි වී ඇති අතර, උතුරු පළාතේ 32 ක්ව පැවති ආයතන සංඛ්‍යාව 35 දක්වා 03 කින් වැඩිවී ඇත.

නැගෙනහිර පළාත සැළකීමේදී 39 ක්වූ ආයතන සංඛ්‍යාව 45 දක්වා 06 කින් වැඩිවී ඇත. එසේම 31 ක්ව පැවති වයඹ පළාතේ ආයතන ගණන 33 දක්වා දෙකකින් වැඩි වී ඇත.

එසේම උතුරු මැද පළාතේ ආයතන ගණන 25 සිට 26 දක්වා එක්(01) ආයතනයකින් වැඩි වී ඇති අතර , ඌව පළාතේ 27 ක් වූ ආයතන ගණනද 28 දක්වා එකකින් (01) වැඩි වී තිබේ. සබරගමුව පළාත සම්බන්ධයෙන් සැළකීමේදී පෙර 26 ක්ව පැවති ආයතන සංඛ්‍යාව 29 දක්වා ආයතන 04 කින් වැඩි වී ඇත.

ආයතන සංඛ්‍යාවේ ක්‍රමික වර්ධනයත් සමඟම වර්තමානයේ බස්නාහිර හා දකුණු පළාත් දෙකෙහි පළාත් පාලන ආයතන ගණන 49 ක් ලෙස සමාන මට්ටමකට පත් වී ඇත.

බලයට පත් රජයන් මඟින් විටින් විට පළාත් පාලන ව්‍යූහයට හා සභිකයින් තෝරා ගැනීමේ මැතිවරණ ක්‍රමවේදයන්ට කරන ලද සංශෝධන, ආයතන සංඛ්‍යාවේ හා නියෝජනය කරන සභික සංඛ්‍යාවේ වෙනස්කම් අවසානයේ මෙරට ආර්ථිකයට සෘජු බලපෑමක් එල්ල කිරීමට සමත් වී ඇති ආකාරය ඉහත තොරතුරු අධ්‍යයනය කිරීම තුළින් පැහැදිළි වේ.

සමස්ථයක් වශයෙන් මෙම අධ්‍යයනය මඟින් අවධානය යොමුකොට සාකච්ඡා කරන ලද දත්ත හා තොරතුරු පිළිබඳව අවධානය යොමු කිරීමෙන් ස්ථාවර ජාතික සැළසුම් හා ප්‍රතිපත්ති රටේ අනෙකුත් අංශවලට මෙන්ම පළාත් පාලන ක්ෂේත්‍රය උදෙසාද ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් රටේ සමස්ථ ආර්ථිකයට හා අවසාන ප්‍රතිලාභීන් වන පොදු මහජනතාවට සිදුවන බලපෑම පිළිබඳව මෙම විශ්ලේෂණය මඟින් අවබෝධ කරගැනීමට හැකිවනු ඇත.

**නිගමන හා නිරීක්ෂණ**

පළාත් පාලන ආයතනවල සභික සංඛ්‍යාවේ ප්‍රමාණාත්මක වැඩිවීම මඟින් ඇති කොට ඇති ප්‍රායෝගික තත්ත්වය පිළිබඳව සංඛ්‍යාලේඛන පාදක කොට ගෙන, නිරීක්ෂණද පාදක කොටගෙන ඉහත විස්තරාත්මකව සාකච්ජා කරන ලද කරුණු කාරණා සැළකිල්ලට භාජනය කොට පහත නිගමන හා නිරීක්ෂණ ඉදිරිපත් කෙරේ.

- පළාත් පාලන ආයතන සභිකයින් තෝරාගැනීම සඳහා පැවති සමානුපාතික නියෝජනය යටතේ පවත්වන ලද මැතිවරණ ක්‍රමවේදය වෙනුවට 1988 දී මිශ්‍ර සමානුපාතික ක්‍රමය යටතේ කොට්ඨාශ පදනම මත නියෝජිතයින් තෝරාගැනීම සභික නියෝජනය දෙගුණවීමට ඍජුව බලපා තිබීම.
- මධ්‍යම රජය මඟින් මුදල් කොමිසම හරහා පළාත් සභාවලට ලබාදෙන ප්‍රතිපාදන වැඩිකිරීමට සිදුවී තිබීම - වාර්ෂිකව රාජ්‍ය අය-වැය මඟින් පළාත් සභාවලට ලබාදෙන ප්‍රතිපාදන ප්‍රමාණයද නියෝජිත සංඛ්‍යාවේ ප්‍රමාණාත්මක වර්ධනයට සාපේක්ෂව ඉහළ නැංවීමට සිදුවීමෙන් මහා භාණ්ඩාගාරයට පළාත් පාලන ආයතන නියෝජිතයින් නඩත්තුව වෙනුවෙන් අමතර වැය බරක් දැරීමට සිදුවී ඇත.
- පළාත් සභා මඟින් පළාත් පාලන ආයතන වෙත ලබාදෙන ප්‍රතිපාදන වැඩිකිරීමට සිදුවීම - එක් එක් පළාත් සභාව යටතේ පාලනය වන පළාත් පාලන ආයතනවලට පත්වී සිටින සභිකයින් ප්‍රමාණයට ගැළපෙන පරිදි වියදම් දැරීමට ප්‍රමාණවත් ප්‍රතිපාදන පළාත් පාලන ආයතනවලට ලබාදීමට සිදුවීම තුළින් එක් එක් පළාත් සභාවලින් ලබාදිය යුතු මූල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණයද ඉහළ අගයක් ගැනීම.
- මහජන ඡන්දයෙන් සභිකයින් තෝරාගැනීමට අමතරව දේශපාලන පක්ෂ ලබාගත් ඡන්ද ප්‍රමාණය මත නම් කරනු ලබන තවත් සභික පිරිසකගේ නියෝජනය තුළින් නිවැරදි මහජන නියෝජනයක් සිදු නොවීම හා එම අමතර සභිකයින් පළාත් පාලන ආයතනවලට අමතර බරක් වී තිබීම.
- සභා රැස්වීම් ශාලාවල ඉඩකඩ ප්‍රමාණවත් නොවීම හේතුවෙන් ශාලා ඉඩකඩ පුළුල් කරගැනීමට සිදුවීම හා ඒ වෙනුවෙන් අමතර මුදල් මුදල් වැය කිරීමට පළාත් පාලන ආයතනවලට සිදුවීම - සීමිත සභික පිරිසකට සුදුසුවන පරිදි පවත්වාගෙන ආ සභා රැස්වීම් ශාලාවල වැඩි වූ අමතර සභික ප්‍රමාණයට රැස්වීමට ප්‍රමාණවත් නොවීම හේතුවෙන් ඒවා පුළුල් කොට පවත්වාගෙනයාමට බොහොමයක් පළාත් පාලන ආයතනවලට සිදුවිය. මෙය එම ආයතනවල වැය බර ඉහළ යාමට බලපා ඇත.
- සභාවල වාර්ෂික වියදම් ඉහළයාම (ප්‍රවාහන,සංග්‍රහ වියදම් ,සභික දීමනා දුරකතන හා ඉන්ධන යනාදී) - වැඩි වූ සභිකයින්ට අවශ්‍ය මෙවැනි මූලික පහසුකම් සැකසීම වෙනුවෙන් ප්‍රතිපාදන යොදාගැනීමට සභාවලට සිදුවී ඇත.

- සභාවල වාර්ෂික ප්‍රතිපාදන කොට්ඨාශ අතර බෙදාහැරීමේ ගැටළු ඇතිවීම - වාර්ෂික අය-වැය ලේඛණය මගින් අමතර සභික පිරිසකටද සීමිත ප්‍රතිපාදන ලබාදීමට කටයුතු කිරීමේදී ප්‍රායෝගික දුෂ්කරතාවන්ට මුහුණදීමට ආයතන ප්‍රධානීන්ට හා පරිපාලනයට සිදුවී ඇත. මෙහිදී සභිකයින් සභා මුහුණදෙන ප්‍රයෝගික තත්ත්වය පිළිබඳ අනවබෝධයෙන් කරන ඉල්ලීම් ඉටුකිරීමට නොහැකිවීම සභාවල මතභේදකාරී පරිසරයක් නිර්මාණය වීමටද හේතු වී ඇත.
- ලබාදෙන ප්‍රතිපාදන බෙදාගැනීම සම්බන්ධයෙන් සභිකයින් අතර ගැටළු/ආරවුල් ඇතිවීම - වාර්ෂිකව සභාවලට ලැබෙන සීමිත ප්‍රතිපාදන සංවර්ධන කටයුතු සඳහා සභිකයින් අතර සමව බෙදාහැරීමේදී අර්බුදකාරී තත්ත්වයන් ඇතිවීම ගැටුම් ඇතිවීමටද බලපා ඇත. මෙය සභිකයින්ගේ ප්‍රමාණාත්මක වැඩිවීම හේතුවෙන් ඇති වී ඇති අනවශ්‍ය තත්ත්වයකි.
- වාර්ෂික අයවැය සකස්කිරීමේදී හා පවත්වාගෙනයාමේදී ගැටළු ඇතිවීම - පළාත් සභා මඟින් ලබාදෙන රාජ්‍ය ප්‍රතිපාදන හා ස්වයං උත්පාදිත ආදායම් මඟින් ලබාගන්නා ප්‍රතිපාදන මත පිළියෙල කරනු ලබන පළාත් පාලන ආයතනවල වාර්ෂික අය-වැය සඳහා යොදාගතහැකි සීමිත ආදායම් වැඩි වූ සභිකයින් කණ්ඩායමක් නඩත්තුකිරීමටද සිදුවීම, බලප්‍රදේශවල සංවර්ධන කටයුතු සඳහා ප්‍රතිපාදන වෙන්කිරීමේදී ප්‍රායෝගික ගැටළුවලට මුහුණදීමට සභාවලට සිදුවී ඇත.
- සභා සතු ආදායම් අමතර සභික පිරිසක් නඩත්තු කිරීමට ප්‍රමාණවත් නොවීම - විශේෂයෙන්ම අඩු සභිකයින් පිරිසකගේ නියෝජනයෙන් පවත්වාගෙන යමින් සිටි සභාවලට අමතර සභික පිරිසක්ද නඩත්තුකිරීමට සිදුවීමෙන් ගැටළුකාරී තත්ත්වක් ඇතිවීම. මෙම තත්ත්වය අමතර ප්‍රතිපාදන ඉල්ලුම්කොට ලබාගැනීමට හෝ වෙනත් වියදම් කපාහැරීම තුළින් පියවාගැනීමට සභාවලට සිදුවී ඇත.
- අඩු ආදායම් සහිත සභාවලට අමතර වැය බර දරා ගැනීමට දුෂ්කරවීම - අඩු ආදායම් සහිත සභා ආර්ථික දුෂ්කරතා මධ්‍යයේ පවත්වාගෙන යමින් සිටියදී අමතර සභිකයින් පිරිසකගේ වැය බර දැරීමට සිදුවීම තුළින් අනපේක්ෂිත තත්ත්වයන්ට මුහුණදීමට සිදුවී තිබීම මහජන සේවා සැපයුම් ක්‍රියාවළිය අඩපණ වීමටද බලපා තිබීම.
- සභා රැස්වීම් වාර්තාකරණයට හා එම වාර්තා පවත්වාගෙනයාමේදී ගැටළු ඇතිවීම - සභා රැස්වීම්වලදී එක් එක් සභිකයින්ගේ අදහස් දැක්වීම් වාර්තා විය යුතු බවට සභිකයින් අපේක්ෂාකරන බැවින්, වැඩි පිරිසකගේ අදහස් දැක්වීම් වාර්තාකරණය කිරීමේදී හා ඒවා වාර්තා පොතක සටහන් කොට පවත්වාගෙන යාමේ අපහසුතාවලට මුහුණදීමට නාගරික කොමසාරිස්වරුන්ට/ සභා ලේකම්වරුන්ට හා සභා වාර්තා කරන නිලධාරීන්ටත් සිදුවී ඇත. මෙම පසුබිම විශාල සභා වාර්තා නඩත්තු කරගෙන යාමටද සභිකයින් සමඟ නිරන්තර ගැටුම් ඇතිවීමටද හේතුවී ඇත.
- සභිකයින්ට අවශ්‍ය ලිපිද්‍රව්‍ය සැපයීම සඳහා අමතර වැය බරක් දැරීමට පළාත් පාලන ආයතනවලට සිදුවීම - මහජන නියෝජිතයින්ගේ පරිහරණයට අවශ්‍ය ලිපිද්‍රව්‍ය සැපයීම සහ

මගින් සිදු කළ යුතු බැවින්, සභිකයින්ගේ ප්‍රමාණාත්මක වැඩිවීම මත ඒවා මිලදී ගෙන සැපයීම උදෙසා දුෂ්කරතාවන්ට මුහුණදීමට සභාවලට සිදුවී ඇත.

- සභා කටයුතු මෙහෙයවීමේදී නගරාධිපතිවරුන්ට/සභාපතිවරුන්ට ගැටළුවලට මුහුණදීමට සිදුවීම - සභිකයින් ගණනාවක් සභා රැස්වීම්වලදී ඉදිරිපත් කරනු ලබන යෝජනා, අදහස් ඉදිරිපත්කිරීමට අවකාශ ලබාදීමේදී හා න්‍යාය පත්‍රයට අනුව සභා පවත්වාගෙන යාමේදී ප්‍රායෝගික ගැටළුවලට මුහුණදීමට ආයතන ප්‍රධානීන්ට සිදුවීම
- වැඩිවූ සභිකයින්ගෙන් පළාත් පාලන ආයතන කටයුතු ප්‍රවර්ධනය උදෙසා ලැබෙන දායකත්වය ප්‍රශස්ත මට්ටක නොපැවතීම- සභිකයින් සංඛ්‍යාව ප්‍රමාණාත්මකව වැඩි වුවද, සභාවල සේවා සැපයුම් ක්‍රියාවලිය ප්‍රවර්ධනය උදෙසා ලබාදෙන දායකත්වය අපේක්ෂිත මට්ටමින් නොලැබෙන බව අනාවරණය වී තිබීම.
- සභික ප්‍රමාණය වැඩිවුවද, බල ප්‍රදේශවල ජනතාවට මහජන නියෝජිතයින්ගෙන් අපේක්ෂිත සේවය නොලැබීම - පෙර සිටි සංඛ්‍යාවට වඩා වැඩි සභික පිරිසක් පළාත් පාලන ආයතනවලට පත්වුනද, සීමිත පිරිසක් යටතේ ඉටු වූ සේවාවන්ට වඩා වැඩි සේවාවක් ඉටුකිරීමට අමතර සභිකයින්ගෙන් දායකත්වයක් සිදුනොවන බව/ප්‍රමාණවත් නොවන බව
- ආයතන ප්‍රධානීන්, සභිකයින් හා නාගරික කොමසාරිස්වරුන්, ලේකම්වරුන්/නිලධාරීන් අතර නිරන්තර මතගැටුම් ඇතිවීමට හේතුවීම - සභිකයින් වැඩි පිරිසක් සමඟ එදිනෙදා පරිපාලනම කටයුතු පවත්වාගෙන යාමේදී හා සභා රැස්වීම් පවත්වාගෙන යාමේදී පරිපාලන ප්‍රධානීන්ට විවිධ අපහසුතාවන්ට මුහුණ පෑමට සිදුවී තිබීම.
- සභා රැස්වීම් පවත්නා කාලය දිගුවීම හා එක් සභිකයෙකුට ලබාදිය යුතු කාලය සීමාවීම - මෙම තත්ත්වය යටතේ පෙරදී වරුවකින් හෝ පැය කිහිපයකින් පවත්වන ලද සභා රැස්වීම් දවස පුරා හෝ වැඩිපුර පැය ගණනක් යොදාගැනීමට සිදුවී ඇත. මෙලෙස පෙරදී සීමිත සභිකයින් කණ්ඩායමකගේ සහභාගීත්වයෙන් පවත්වාගෙන ආ සභා රැස්වීම් පවත්වන කාල සීමාව වැඩි වූ සභිකයින් ප්‍රමාණයට ගැළපෙන පරිදි දීර්ඝකිරීමට සිදුවීමෙන් ගත කළ යුතු කාලය වැඩිවීමද ඒ හේතුවෙන් සංග්‍රහ, දීමනා හා විදුලිය හා වෙනත් වියදම් ඉහළයාමටද බලපා තිබීම.
- 2011 සිටි සභික සංඛ්‍යාව 2018 දී දෙගුණයක් බවට පත්වීම සංඛ්‍යාත්මකව හුදු පුද්ගල වර්ධනයක් ඇතිවීමට මිස එය ආයතනික වර්ධනය උදෙසා ඉවහල් නොවීම - එතෙක් සභා නියෝජනය කළ සභිකයින්ගේ ප්‍රමාණය කොට්ඨාශ පදනම හා සමානුපාතික නියෝජනය යටතේ ප්‍රමාණාත්මකව ඉහළ යාම පළාත් පාලන ආයතන තුළ මහජන නියෝජනය වැඩිවීමකට හේතුවී තිබුනද, එමගින් අපේක්ෂිත සේවා සැපයුම් ක්‍රියාවලියේ වර්ධනයක් ඇතිවී පළාත් පාලනයේ ප්‍රගමනයක් තිබෙන බව නිරීක්ෂණය නොවීම .
- සභිකයින් වැඩි පිරිසක් පාලනයට සහභාගීවීම සම්බන්ධයෙන් ඇති නොකමැත්ත හා සමහර සභාවල ජ්‍යෙෂ්ඨ සභිකයින් විසින් සභාවල ආධිපත්‍ය පතුරුවමින් කටයුතු කිරීම - සභික සංඛ්‍යාව දෙගුණ වීමත් සමඟ සභාවලට සම්බන්ධ වී සිටින නවක සභිකයින්ට සභා කටයුතු වලදී තම අදහස් ප්‍රකාශකිරීමට ඇති අවස්ථා අහුරා ඔවුන්ගේ සහභාගීත්වය/මතය නොසළකා

සමහර පළාත්වල සමහර සභාවල කටයුතු සිදුවන බවට විමර්ශන නිලධාරීන් මඟින් තොරතුරු අනාවරණය වී ඇත. මෙම තත්ත්වය සභිකයින්ට සභාවලට පැමිණ හුදෙක් සිදුවන දේ බලාසිටීමට සිදුවන තත්ත්වයක් ඇති කොට තිබීම සභිකයින්ගෙන් සිදුවන සේවාව පහල යාමටද බලපා ඇත. එසේම මෙම පසුබිම අනවශ්‍ය මුදල් නාස්තියකටද හේතු වී ඇත.

- මහජන ඡන්දයෙන් තේරීපත්වන සභිකයින්ට අමතරව, ජනතා මනාපය නොමැති පක්ෂවල මනාපය මත පත්කරන ලද සභිකයින් පිරිසක්ද පළාත් පාලන ආයතන පාලනයට එක්වීම තුළින් ඔවුන්ගෙන් අපේක්ෂිත මට්ටමේ ජනතා නියෝජනයක් සිදුවන්නේද යන්න හා ලබාදෙන දායකත්වය ද කොතෙක්දුරට ජනතාවට ප්‍රයෝජනවත් වන්නේද යන වග.
- එකම කොට්ඨාශයට සභිකයින් කිහිප දෙනෙක් පත්වීම - මෙමඟින් තම සේවා අවශ්‍යතාවන් ලබාගැනීමේදී කවර සභිකයා සම්බන්ධකරගත යුතුද යන්න පිළිබඳව තීරණය කරගැනීම උදෙසා අනවශ්‍ය පීඩාවන්ට පත්වීමට හා බලපෑම්වලට නතුවීමට සිදුවීම මඟින් ජනතාව අපහසුතාවට පත්වීම හා දේශපාලන අනුග්‍රාහය මත කටයුතු සිදුවීම.
- ග්‍රාම නිලධාරී වසම් බෙදීයාම- එකම ග්‍රාම නිලධාරී වසම කොට්ඨාශ කිහිපයකට බෙදීයාම තුළින් පරිපාලනමය ගැටළුවලට මුහුණදීමට ග්‍රාම නිලධාරීන්ට සිදුවීම සභිකයින්ගෙන් සේවා අවශ්‍යතා පවත්වාගෙන යාමටද ගැටළු ඇතිවීම
- සභාවල උන්නතිය උදෙසා කාන්තා සභිකවරියන්ගේ දායකත්වය ලබාගැනීම අවම මට්ටමක පැවතීම - පළාත් පාලනය සඳහා හිමි වූ 25% කාන්තා නියෝජනය යටතේ සභිකවරියන් පත්වුනද, අපේක්ෂා කළ පරිදි ඔවුන්ගෙන් සභාවල කටයුතු පවත්වාගෙන යාම සඳහා සැළකිය යුතු දායකත්වයක් ලැබෙන්නේද යන්න පිළිබඳව පවතින විවේචනාත්මක පසුබිම. මෙම තත්ත්වය හුදු සභාවල කාන්තා නියෝජනයේ වැඩිවීමකට මිස ජනතාවගේ අභිවෘද්ධිය උදෙසා ඔවුන්ගේ දායකත්වය ලබාගැනීමට පසුබිම නිර්මාණය වී නොතිබීම.
- කාන්තා සභිකවරියන්ට සභා කටයුතුවලට දායකවීමේදී පිරිමි සභිකයින්ගෙන් නිරන්තර බාධා එල්ලවන බවට නිරීක්ෂණය වී තිබීම. මෙහිදී අඩු සැළකිලි හා ගැරහීම්වලට කාන්තා සභිකවරියන් ලක්වන බව හෙළිදරව් වීම. කාන්තා සභිකවරියන් වීම හේතුවෙන් පිරිමි සභිකයින් සභා කටයුතුවලට දායක වීමට ප්‍රමාණවත් අවස්ථා ලබානොදීම හේතුවෙන් තමන්ගේ උපරිම දායකත්වය සභාවලට ලබාදීම අවමවීමටද, කාන්තා හඬ යටපත්කිරීමටද බලපෑම් එල්ලවන බවටද තොරතුරු ඉදිරිපත්ව තිබීම.
- සභාවල තරුණ නියෝජනය අපේක්ෂිත පරිදි වර්ධනය නොවීම හා තවදුරත් වැඩිහිටි පිරිස් සභිකයින් ලෙස සභා නියෝජනය කිරීම - පළාත් පාලනයේ තරුණ නියෝජනය සඳහා ලබාදී ඇති ප්‍රතිශත නියෝජනය අනිවාර්ය කොට නොතිබීම හේතුවෙන් පළාත් පාලන ආයතන සඳහා තරුණ අපේක්ෂකත්වය ඉහළ මට්ට්ටමකට නොයාම හේතුවෙන් තරුණ සභිකයින්ගේ නියෝජනය නොලැබීමට බලපා තිබීම. මෙම පසුබිම මත නිර්මාණශීලිව හා ජවසම්පන්න නවක තරුණ පිරිස්වලට සභා නියෝජනයට තිබූ අවස්ථා වැළකී තිබීම හා සභික නියෝජනය දෙගුණකිරීම මඟින් අපේක්ෂිත ප්‍රතිපල අත්කරගැනීමට නොහැකිවී තිබීම.

- පළාත් පාලන ආයතන සභිකයින්ගෙන් මහජනතාව අපේක්ෂිත කාර්යභාරය ඉටුනොවීම. සිය කැමැත්ත ප්‍රකාශකිරීම මඟින් පත්කරගනු ලබන මහජන නියෝජිතයින්ගෙන් පළාත් පාලන බල ප්‍රදේශවල සිටින ජනතාව නැතහොත් සේවාලාභීන් අපේක්ෂා කරනුයේ මනා සේවාවක් ලබාදීමට අවශ්‍ය කටයුතු කරවා ගැනීමය. එහෙත් 2018 ට පෙර පත්ව කටයුතු කළ දැනට සිටින සභිකයින්ගෙන් හරි අඩකට වඩා අඩු සංඛ්‍යාවෙන්ද අපේක්ෂිත සේවාවක් නොලැබී ඇති බවට විවේචන තිබියදී එම සංඛ්‍යාව දෙගුණවීම තුළින් සේවා සැපයුම් ක්‍රියාවලියේ අමතර වර්ධනයක් සිදුවී ඇති බවට නිරීක්ෂණය නොවීම.
- ජනතාවගේ මනාපය නොලබා පරාජයට පත් වූ සභිකයින් වුවද නැවත සභිකයින් වශයෙන් සභාවලට නම්කිරීමට පක්ෂවලට හිමි බලය/අවසථාව හේතුවෙන් නම්කළ සභිකයින් වශයෙන් ජයග්‍රහණය කළ සභිකයින් සමඟ කටයුතු කිරීමට පළාත් පාලන ආයතනවලට පත්කිරීම. එතුළින් ජනතාව විසින් වරක් ප්‍රතිෂේප කරන ලද අපේක්ෂකයින් නැවත  පත්වීම මහජන මතය  විකෘති වීමක් බවට පත්වී තිබීම.
- විටින් විට බලයට පැමිණි ආණ්ඩු මඟින් ක්‍රියාත්මක කොට ඇති ප්‍රතිපත්මය තීරණ හා පළාත් පාලන මැතිවරණ ක්‍රමවේදයන්හි වෙනස් කිරීම් පළාත් පාලන ආයතන සංඛ්‍යාව හා සභික ප්‍රමාණය අඩුවීමට හා වැඩිවීමට බලපා ඇති බව.

**නිර්දේශ**

ඉහත සඳහන් නිගමන හා නිරීක්ෂණ ද සැළකිල්ලට ගෙන ඒවා මගහරවාගැනීම සඳහා ඉදිරිපත් කරනු ලබන නිර්දේශ පිළිබඳව අදාළ අංශවල අවධානය යොමු විය යුතුය.

- මධ්‍යම රජයට, පළාත් සභාවලට පමණක් නොව පළාත් පාලන ආයතනවලටද මුහුණදීමට සිදුවී ඇති අනවශ්‍ය මූල්‍ය පිරිවැය අවමකිරීම උදෙසා පළාත් පාලන ආයතනවල සභික ප්‍රමාණය සංශෝධනය කිරීමට නොපමාව කටයුතු කිරීම. - මෙමගින් සභා නියෝජනය කළ යුතු සභිකයින් සංඛ්‍යාව 2017 තිබූ ප්‍රමාණයට ආසන්න සුදුසු නියෝජනයකට ගෙන ඒමට වහා කටයුතු කළ යුතුය. විශේෂයෙන් වර්තමානයේ රට මුහුණදී සිටින ආර්ථික අර්බුද හමුවේ මහා නගර සභා, නගර සභා හා ප්‍රාදේශීය සභා යන පළාත් පාලන ආයතන වර්ගවල සිටිය යුතු උපරිම සභික සංඛ්‍යාව ප්‍රායෝගික නිර්ණයකවලට පදනම් කොටගෙන නිශ්චය කළ යුතුය. මෙහිදී තරුණ හා කාන්තා නියෝජනයන්යද ආරක්ෂාවන පරිදි නිවැරදිව පත්විය යුතු සභික සංඛ්‍යාව නිශ්චය කළ යුතුය. ඒ අනුව 4493 සිට 8740 දක්වා වැඩිවී ඇති සභික සංඛ්‍යාව ආර්ථිකයට දැරිය හැකි ප්‍රමාණයකට අඩුකර ගැනීමට හැකි නියෝජිතයින් තෝරා ගැනීමේ ක්‍රමවේදයකට අනුගත විය යුතුය.
- මේ සඳහා පළාත් පාලන ආයතන සභිකයින් තෝරා ගැනීම සඳහා 2017 පළාත් පාලන මැතිවරණය සඳහා යොදාගත් මිශ්‍ර සමානුපාතික ක්‍රමවේදය වෙනුවට කොට්ඨාශ මට්ටමින් පමණක් මහජන නියෝජිතයින් තෝරාපත්කර ගැනීමේ ක්‍රමවේදයක් හඳුන්වාදීම. ඒ සඳහා අවශ්‍ය සංශෝධන සිදුකිරීම මගින් මෙවැනි ක්‍රමවේදයක් හඳුන්වාදීම තුළින් දැනට සිටින සභිකයින්ගේ ප්‍රමාණය 60% කින් පමණ අඩුකර ගැනීමට හැකිවනු ඇත. මෙමඟින් දැනට තම බල ප්‍රදේශවලට වගකිව යුතු මහජන නියෝජිතයින් නොමැතිවීමේ අඩුපාඩුව වළකා ගැනීමටද, සභිකයින් විශාල ප්‍රමාණයක් නඩත්තු කිරීමේ පිරිවැය අවම කර ගැනීමටද හැකි වනු ඇත.
- එක් එක් පක්ෂ ලබාගත් ඡන්ද ප්‍රතිශතය මත පක්ෂවලට සභිකයින් නම්කිරීමට ලබාදී ඇති අවස්ථාව ඉවත්කිරීම - දේශපාලන පක්ෂවල හා දේශපාලන නායකයින්ට අවශ්‍ය පිරිදි නම්කරනු ලබන නියෝජිතයින් පළාත් පාලන ආයතන සභිකයින් වශයෙන් නියෝජනය කිරීමට ලැබී ඇති අවස්ථාව හේතුවෙන් ජනතා කැමැත්ත නොමැති අතිරේක සභික කණ්ඩායමක් සභාවලට සම්බන්ධවීම මගින් ඔවුන් නඩත්තුව වෙනුවෙන්ද අනවශ්‍ය බරක් දැරීමට සභාවලට සිදුවී ඇති බැවින් එම තත්ත්වය නිවැරදිකිරීමට කටයුතු කළ යුතුය. මහජනතාවගේ ඡන්දයෙන් පත්වන ප්‍රායෝගිකව නිශ්චය කරනු ලබන සභිකයින් සංඛ්‍යාවකට පමණක් සභා නියෝජනයට අවස්ථාව ලබාදීම මගින් අනවශ්‍ය මූල්‍ය පිරිවැය වළකාගැනීමට හා ගැටළු අවම කරගැනීමටද හැකි වනු ඇත. තවද, පරාජිත අපේක්ෂකයින් පක්ෂ මඟින් නැවත සභාවලට නම් කිරීම ද වළකා ගැනීමට හැකි වනු ඇත.
- සභික නියෝජනය දෙගුණවීම හේතුවෙන් මෙරට ආර්ථිකයට එල්ල වී තිබෙන සෘජු බලපෑම අවම කරගැනීමට කටයුතු කිරීම. ආර්ථිකයට සිදුවන්නාවූ බලපෑම් පිළිබඳව අවධානය යොමු

නොකොට හුදෙක් දේශපාලනික අවශ්‍යතා සපුරාගැනීම උදෙසා ප්‍රමාණාත්මකව සභික සංඛ්‍යාව වැඩිකිරීමට කටයුතු කිරීමෙන් ඇතිවී තිබෙන තත්ත්වය සැළකිල්ලට ගෙන කුඩා රටකට ඔරොත්තුදෙන මට්ටමේ පළාත් පාලන නියෝජනයක් ඇතිකොට ආර්ථික පීඩනය අවම කරගැනීමට නොපමාව පියවරගත යුතුය.

- පළාත් පාලන ආයතන සභිකයින්ගේ සේවාව ගරු සේවාවක් බවට පත්කිරීමට කටයුතු කිරීම මඟින් දීමනා  ගෙවීම සඳහා වැයවන පිරිවැය අවම කරගැනීමට කටයුතු කිරීම. මේ සඳහා 1987ට පෙර පැවති ගරු සේවාවන් සැපයීමේ ක්‍රියාදාමය නැවත හඳුන්වාදීමට කටයුතු කිරීම. එමඟින් වරප්‍රසාද රහිතව මහජනතාවට සේවය කිරීමට ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වන නියෝජිතයින්ගේ දායකත්වය ලබාගැනීමටද තනතුරු වරප්‍රසාද ලබාගැනීම සඳහා මහජන නියෝජිතයින් ලෙස ඉදිරිපත්වීම අධෛර්යමත් කිරීමටද හැකිවනු ඇත.
- කාලය කළමනාකරණය සඳහා අවම සභික නියෝජනයක් පවත්වාගැනීමට අවශ්‍ය පියවර ගැනීම - සභිකයින් විශාල පිරිසක් නියෝජනය කිරීමේදී අනවශ්‍ය ලෙස වැය කිරීමට  සිදුවන කාලය අවම කොට ඵලදායී ලෙස කළමනාකරණය කරගැනීම සඳහා සභාවක සිටිය යුතු සභික සංඛ්‍යාව සීමිත විය යුතුය. එබැවින් ඵලදායී ලෙස කාලය කළමනාකරණය කොට පළාත් පාලන ආයතනවල සේවා සැපයුම් ක්‍රියාවළිය පවත්වාගෙන යා හැකි ප්‍රමාණයකින් සභික නියෝජනය පවත්වාගැනීමට කටයුතු කළ යුතුය.
- පළාත් පාලන ආයතනවලට පත්වන නියෝජිතයින්ට සභා කටයුතු පිළිබඳ ප්‍රමාණවත් දැනුම සභාවල දිව්රුම්දී නිල වශයෙන් වැඩ බාරගැනීමට පෙර ලබාදීම හා එම පුහුණු අනිවාර්ය සාධකයක් බවට පත්කිරීම මඟින් ඵලදයීතාව ඉහළ නැංවීමට කටයුතු කිරීම - පළාත් පාලන ආයතනවලට පත්වන නියෝජිතයින් පුහුණු වැඩසටහන්වලට/දැනුවත් කිරීම්වලට සහභාගීවීමට දක්වන උනන්දුව ප්‍රමාණවත් නොවන බැවින්, ඒ පිළිබඳව විශේෂ අවධානය යොමුකළ යුතුය. සභිකයින් වශයෙන් තේරී පත්වන සියලුම මහජන නියෝජිතයින් දින කිහිපයක ප්‍රායෝගික ක්‍රියාකාරකම් සහිත දැනුවත්කිරීමේ පුහුණු වැඩසටහනකට සහභාගීවීම අනිවාර්ය කළ යුතු අතර, එසේ ලබාගන්නා පුහුණු වැඩසටහන්වලට සහභාගී වූ බවට තහවුරු කරගැනීමෙන් පසු පමණක් ඔවුන්ට සිය දිව්රුම්දීම සඳහා අවස්ථාව ලබාදිය යුතුය. මෙමඟින් අනවශ්‍ය ලෙස විනය විරෝධී හැසිරීම් ඇතිවීම වළකා සභා රැස්වීම්වල කටයුතු අඩපණවීම අවම කරගැනීමට හා අනවශ්‍ය පිරිවැය වළකා ගැනීමටද හැකිවනු ඇති අතර, එය සභා රැස්වීම්වල ඵලදායීතාවය නංවාගැනීමටද  ඉවහල් වනු ඇත.
- විමර්ශන නිලධාරීන් මඟින් පළාත් පාලන ආයතනවල මහජන නියෝජිතයින්ගේ කාර්ය සාධනය ඇගයීමට ලක් කිරීම -  පළාත් පාලන ආයතනවලට වසර 04 ක කාලයක් සඳහා තේරීපත්වන සභිකයින් විසින් ඔවුන්ගෙන් මහජනයා අපේක්ෂාකරන සේවාව ඉටුකරන්නේද/ඉටුවන්නේද යන්න පිළිබඳ ඇගයීමක් හෝ පසුවිපරමක් දැනට ක්‍රියාත්මක නොවන බැවින් සභා තුළ ඔවුන්ගේ ක්‍රියාකාරීත්වය හා ලබාදෙන ප්‍රතිපාදන සේවා සැපයුම් ක්‍රියාවළිය උදෙසා යොදාගැනීම පිළිබඳවත් සොයා බැලීමට පළාත් පාලන දෙපාර්තමේන්තුවේ සේවයකරන  විමර්ශන නිලධාරීන්ගේ සහාය ලබාගත යුතුය. දැනට විනය පරීක්ෂණ

පැවැත්වීම වැනි සාමාන්‍ය කටයුතුවලට යොමුකොට සිටින විමර්ශන නිලධාරීන් සභාවල මෙවැනි කටයුතු සඳහා දායක කරගැනීම ඔවුන්ගේ සේවාවේ අභිමානය වර්ධනය වීමටද, සභාවල සේවා සැපයුම් ක්‍රියාවළිය ප්‍රශස්ථ මට්ටමකට ගෙනයාමටද ඉවහල්වනු ඇත. මහජන මුදලින් මාසික දීමනා ඇතුළුව වෙනත් වරප්‍රසාදවලට හිමිකම් කියන සභිකයින්ගෙන් අපේක්ෂිත සේවය ජනතාවට/සේවාලාභීන්ට ලැබෙන්නේද යන්න සොයා බැලීම මඟින් මහජනතාවට වගවීම පිළිබඳ සොයා බැලීමක්ද සිදුවනු ඇත.

- සභා කටයුතු සම්බන්ධයෙන් සභිකයින්ට ප්‍රමාණවත් පුහුණුව/දැනුවත්භාවය ලබාදීමට කටයුතු කිරීම - විනය විරෝධී ලෙස සභා රැස්වීම් කටයුතු සිදුවීම නිරන්තරයෙන් නිරීක්ෂණය වන බැවින් සභාවක හැසිරීම සම්බන්ධයෙන් සභිකයින්ට ප්‍රායෝගික දැනුවත්කිරීම් මඟින් අවශ්‍ය දැනුම අවබෝධය ලබාදිය යුතුය. සභාවල උන්නතිය උදෙසා දායකවීමට ප්‍රමාණවත් අවබෝධයක් නොමැති සභිකයින් හඳුනාගෙන ඔවුන්ට විශේෂ දැනුවත්කිරීම් සිදුකිරීමටද කටයුතු කළ යුතුය.
- සභා රැස්වීම් නිරීක්ෂණය කිරීම සඳහා සභාවේ ප්‍රජා කමිටුවලට අවස්ථාව ලබාදීම - පළාත් පාලන ආයතනවල මාසික සභා රැස්වීම් නිරීක්ෂණය කිරීම සඳහා අවස්ථාව ලබාදී තිබුනද එය ප්‍රායෝගිකව ක්‍රියාත්මක වනුයේ ඉතා අල්ප වශයෙනි. එබැවින් මහජනයා නියෝජනයන කරන ප්‍රජා කමිටුවලට සභා රැස්වීම් නිරීක්ෂණය කිරීමටද, ඔවුන්ගේ නිරීක්ෂණ සභා කටයුතු පවත්වාගෙනයාමේදී සිදුවන දුර්වලතා/අඩුපාඩු හඳුනාගෙන ඒවා අවමකරගැනීමටද යොදා ගැනීමට හැකිවනු ඇත. එමඟින් විනයානුකූල නොවනා ආකාරයෙන් සිදුකෙරෙන හැසිරීම් යම් ප්‍රමාණයකට අවම කරගැනීමට හා න්‍යාය පත්‍රයකට අනුව රැස්වීම් පවත්වනු ලබන්නේද යන්න නිරීක්ෂණය කිරීමටද හැකි වේ.
- පළාත් පාලනය සඳහා හිමි වූ 25% කාන්තා නියෝජනය යටතේ සභිකවරියන් සැළකිය යුතු ප්‍රමාණයක් පත්වීමද සභික ප්‍රමාණය දෙගුණ වීමට හේතුවී ඇති බැවින් එහි ප්‍රායෝගික භාවිතය පිළිබඳව නැවත සලකා බැලීම - සභාවල කටයුතු පවත්වාගෙන යාම සඳහා කාන්තා සභිකවරියන් ලබාදෙන දායකත්වය ඇගයීමකට ලක්කොට, අත්‍යාවශ්‍යයෙන්ම ඔවුන්ගේ නියෝජනය ලැබෙන පරිදි ලබා දී ඇති කෝටාව ආරක්ෂාවන පරිදි අනවශ්‍ය ලෙස වැඩි වී ඇති සභික සංඛ්‍යාව ප්‍රශස්ථ මට්ටමක පවත්වාගැනීමට කටයුතු කිරීම .
- කමිටු ක්‍රමය ශක්තිමත් කිරීම - සභිකයින් කොතෙක් වැඩි වුවද, සභාවල කටයුතු විධිමත්ව පවත්වාගෙන යාම සඳහා තවමත් කමිටු ක්‍රමය පළාත් පාලන ආයතන තුළ පවත්වාගෙන යාම අපේක්ෂිත මට්ටමක නොපවතී. විශේෂයෙන් ප්‍රාදේශීය සභාවල මෙම තත්ත්වය දුර්වල මට්ටමක පවතී. කාන්තා සභික නියෝජනය ප්‍රමාණයෙන් වැඩි වුවද ඔවුන්ගේ හඬ සභා තුළ පවත්වාගැනීමට අවශ්‍ය කාන්තා කමිටු තවමත් ස්ථාපිත කොට නොමැති බව අනාවරණය වී ඇති බැවින් එම තත්ත්වය නිවැරදි කිරීමට අවශ්‍ය පියවර ගතයුතුය. ප්‍රාදේශීය සභාවක අවම වශයෙන් සක්‍රියව කමිටු හතරක් හෝ අවශ්‍යතාව පරිදි ඊට වැඩි ප්‍රමාණයක් වුවද පවත්වා ගත හැකි වුවත් තවමත් එවැනි පසුබිමක් ප්‍රායෝගිකව ක්‍රියාත්මක නොවන බැවින් ඒ සඳහා අවශ්‍ය මැදිහත්වීම් සිදු කළ යුතුය.

- මහජන නියෝජිතයින් ලෙස අපේක්ෂකත්වය ලබාදීම උදෙසා නිර්ණායක ලබාදීම- බිම් මට්ටමේ මහජන උපයෝගීතා සේවාවන් සපයන පළාත් පාලන ආයතනවල නියෝජිතයින් ලෙස අපේක්ෂකත්වය ලබාගැනීමේදී නිර්ණායක පදනම් කර නොගන්නා බැවින්, මහජන නියෝජිත කාර්යභාරය හා වගකීම් ඉටුකිරීමට හැකි හා නොහැකි සභිකයින් තේරීපත්වීම මෙම ආයතනවලින් මහජනයාට ලැබිය යුතු සේවාවන් අකර්මන්‍ය වීමට බලපා ඇත. මෙවැනි සුදුසු නිර්ණායක හඳුන්වාදීම තුළින් එවැනි තත්ත්වයන් පැවතීම අවම කරගැනීමට හැකිවනු ඇත. කිසිඳු සැළකිල්ලක් නොදක්වා ඕනෑම අයෙකුට අපේක්ෂකත්වය ලබාදීම හේතුවෙන් මහජන නියෝජනය පිළිබඳ ජනතා විශ්වාසය බිඳවැටීමටද මෙම පසුබිම හේතු වී ඇත.
- තරුණ හා කාන්තා නියෝජනය ආරක්ෂා වන පරිදි ජනතා නියෝජනය නිවැරදිව ප්‍රකාශනය වන රටේ ආර්ථිකයට දැරිය හැකි ප්‍රමාණයේ සුදුසු සභික නියෝජනයක් නිශ්චය කොට ස්ථාපිත කිරීම. මෙමගින් විටින් විට බලයට පත්වන රජයන් මඟින් විවිධ ක්‍රම අනුගමනය කිරීමෙන් සභික සංඛ්‍යාවන්හි විචලනයන් සිදුකිරීම වළක්වාගත හැකිවනු ඇත.
- නිවැරදිව ජනමතය ප්‍රකාශනය වන සුදුසු පළාත් පාලන මැතිවරණ ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම. මහජනතාවට වගවිය යුතු සභිකයින් පිරිසක් ඡන්ද දායකයින්ගේ අභිමතය පරිදි කොට්ඨාශ මට්ටමින් තෝරා පත්කර ගත හැකි නියෝජන ක්‍රමවේදයක් සහිත මැතිවරණ ක්‍රමයක් ස්ථාපිත කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය.

දැනට පළාත් පාලන ආයතනවල රටේ ආර්ථිකයට ඔරොත්තු නොදෙන මට්ටමක පවත්නා පළාත් පාලන ආයතන සභික නියෝජනය අවමකොට මහජන හිතකාමී සේවාවන් ලබාදෙන ආයතන පද්ධතියක් බවට පත්කිරීම උදෙසා ඉහත නිර්දේශ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කඩිනම් පියවර ගැනීමට අදාළ වගකිවයුතු අංශ ක්‍රියාත්මක වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

එසේම 1989 ට පෙර මෙන්, පළාත් පාලන ආයතනවලට පත්වන සභිකයින් රජයේ දීමනා නොලබන ස්වේච්ඡාවෙන් ජනතා සේවයට කටයුතු කරන බල ප්‍රදේශයට වගවන ගරු තනතුරු හොබවන පිරිසක් බවට සභිකයින් පත් කිරීමටද අවධානය යොමු කළ යුතුය. එමඟින් දීමනා, වරප්‍රසාද ලබාගැනීම සඳහා පළාත් පාලන ආයතනවල නියෝජනය ලැබීමට උත්සාහ දැරීම අධෛර්යමත් කිරීමට කටයුතු කිරීමටද, එමඟින් රාජ්‍ය පිරිවැය අවම කරගැනීමටද, නුසුදුසු පුද්ගල නියෝජනය වළකා ගැනීමටද හැකි වනු ඇත.

## ආශ්‍රිත තොරතුරු මූලාශ්‍ර Reference Sources


1. Number of elected members for each LA, Extra Ordinary Gazette No. 2043/56 dated 02. 11. 2017
2. LA Election results, 2011, Election Department website;
3. Number of overhang members - Election Commission website
4. Members allowances details, Gazette Notices issued by each Provincial Council
5. A.G.D.'s Sri Lanka bulletin LAs, 1981
6. Population Data for wards and GN Divisions in 1987, Department of Census and Statistics
7. Commission report on Local Government Reforms, September, 1999